# පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

# වාර්ෂික වාර්තාව - 2014

**ප්‍රධාන කාර්යාලය :**
ජී-22 කෘෂිකර්ම අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය",
නො:80/5, රජමල්වත්ත පාර
බත්තරමුල්ල
ශ්‍රී ලංකාව.

**පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය :**
ජයන්ති මාවත.
අනුරාධපුරය,
ශ්‍රී ලංකාව

## සභාපතිතුමාගේ පණිවුඩය

කෘෂිකර්මාන්තයේ පෙර අස්වනු ක්‍රියාකාරකම් හා සැසඳීමේදී අඩු සංවර්ධනයක් පෙන්වා ඇති බැවින් පසු-අස්වනු වර්තමානයේදී ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වඩාත් වැදගත් විෂයයක් බවට පත් වී ඇත.දීර්ඝ කාලීන පර්යේෂණ සහ සංවර්ධන ප්‍රයත්නයන් හේතුවෙන් පෙර අස්වනු ක්‍රියාකාරකම් හොඳින් දියුණු වී ඇත. වෙනත් ආසියානු රටවල් හා සැසඳීමේදී ශ්‍රී ලංකාව ඉහළ කෘෂිකාර්මික ඵලදායීතාවයක් වාර්තා කරන බව පැහැදිලිය.කෙසේවෙතත්, ඉහළ ඵලදායීතාවයක්/අස්වැන්නක් ලැබුවද පසු අස්වනු ක්‍රියාකාරකම් හේතුවෙන් එය විනාශයට පත් වේ. පලතුරු සහ එළවළු වල පසු අස්වනු හානිය 20-40% ක් සහ ධාන්‍ය සහ මාෂ භෝග වල එය 10-15% වන බව ඇස්තමේන්තු කර ඇත.එබැවින්, මෑතකදී පසු අස්වනු හානි අවම කිරීම සඳහා රජය මූලිකත්වය ලබා දී ඇත.

පසු අස්වනු හානි අවම කිරීම සහ කෘෂි නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් 2000 වර්ෂයේදී පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය (ප.අ.පි.තා.ආ.) පිහිටුවන ලදී. පසුගිය වසර 10ක කාලයක් තුල ප.අ.පි.තා.ආ. විසින් දිවයිනෙහි පසු අස්වනු ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති,පුහුණු සහ සංවර්ධන වැඩසටහන් රාශියක් පවත්වා ඇත. එබැවින්, වර්තමානයේදී ප.අ.පි.තා.ආ. විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වී ඇත. අනාගතයේදී ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආහාර නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා ප.අ.පි.තා.ආ. යේ සේවාවන් වඩාත් පුළුල් කිරීමට සැලසුම් කර ඇති අතර එහි ප්‍රතිඵල මෙම රටෙහි මහජනතාව වෙත ගලා යනු ඇති අතර එය ප.අ.පි.තා.ආ. යේ අවසන් අරමුණ වේ.

ජගත් පාලිත ජයවර්ණ
සභාපති
පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

## අධ්‍යක්ෂවරියගේ පණිවුඩය

කල්තබාගත හැකි සහ කල්තබාගත නොහැකි නිෂ්පාදන හානිය අවම කිරිමේදී සහ මෙම කෘෂිකාර්මික වෙළඳ භාණ්ඩ වල ගුණාත්මකභාවය සහ පෝෂණීය සංඝටක පවත්වාගැනීමේදී පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයට (ප.අ.පි.තා.ආ.) ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරිමට ඇත. හානි ඇගයීමේ සමීක්ෂණ කිහිපයක් පැවැත්වීමෙන් පසුව ප්‍රවාහනය සඳහා දෘඩ ඇසුරුම් හඳුන්වාදීම මඟින් කල්තබාගත නොහැකි වෙළඳ භාණ්ඩවලට වර්තමානයෙදී සිදුවන ඉහළ හානිය අඩු කර ගැනීම සඳහා ප.අ.පි.තා.ආ. එහි පර්යේෂණ වැඩසටහන්පසුගිය වසර කිහිපය තුලදී ප්‍රතිදිශානත කරමින් සිටි.

ආයතනය විසින් භාරගන්නා ලද පර්යේෂණ ක්‍රියාකාරකම්, කර්මාන්තයට සෘජුවම අදාල වන ගැටළු නිරාකරණය කිරීම ඉලක්ක කර පවතී.නැවුම් වෙළඳ භාණ්ඩ සඳහා සුදුසු ඇසුරුම් ක්‍රමවේද සැලසුම් කරමින් සහ සංවර්ධනය කරමින්, පලතුරු සහ අල වර්ග වල පසු අස්වනු ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා තාක්ෂණික ක්‍රමවේද සංවර්ධනය කරමින්, GRAS රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් පසු අස්වනු රෝගාබාධ මර්දනය කරමින් අපගේ නිලධාරීන් කල්තබාගත නොහැකි වෙළඳ භාණ්ඩවලට සිදුවන හානි අවම කිරීම සඳහා වෙහෙස මහන්සි වී වැඩ කර ඇත.තවද, සහල් සහ වෙනත් ධාන්‍ය කර්මාන්තයන්හි භාවිතා කරන ලද තාක්ෂණික ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම මෙන්ම නිෂ්පාදන සංවර්ධන සහ අපද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් පර්යේෂණ වැඩසටහන් කිහිපයක් සිදු කර ඇත.

ඵලදායී තාක්ෂණ ව්‍යාප්තියක් ඉලක්ක කර ගනිමින් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් සිදු කිරීමතුලින් ප.අ.පි.තා.ආ. මෙම වර්ෂයේදී එහි විෂය පථය පුළුල් කරගෙන ඇති අතර එමඟින් ස්වයං රැකියා ආරම්භ කිරීම තුලින් ආදායම් මට්ටම ඉහළ නංවා ගැනීමෙන් බොහොමයක් ග්‍රාමීය අංශ ප්‍රතිලාභ ලබා ඇත.

ජාතියේ වර්තමාන සහ අනාගත සංවර්ධන වැඩසටහන්වලට ඵලදායීව දායකත්වය දැක්වීමට නම් මානව සම්පත් සංවර්ධනයෙහි ආයෝජනය කිරීමට සහ මෙම වර්ගයේ ආයතනයකට අවශ්‍ය තීක්ෂණ විද්‍යාඥයින් සහ සහායක කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම සිදු කල යුතු වේ. අවශ්‍ය සම්පත් ලබා දුන්විට මව්බිම සඳහා පසු අස්වනු තාක්ෂණය සංවර්ධනය කිරීමේ, යොදාගැනීමේ සහ ව්‍යාප්ත කිරීමේ මධ්‍යස්ථානය ලෙස ප.අ.පි.තා.ආ. එහි කාර්යභාරය සපුරාලනු ඇත.

ආචාර්ය බී.එම්.කේ.එස්.තිලකරත්න
අධ්‍යක්ෂිකා
පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ
ආයතනය
ජී-22 කෘෂිකර්ම අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය",
නො:80/5, රජමල්වත්ත පාර
බත්තරමුල්ල
2015.10.31

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා
කෘෂිකර්ම අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය",
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

**වාර්ෂික වාර්තාව - 2014**

1971 අංක 38 දරන මුල්‍ය පනතෙහි 14(2) ඡේදය ප්‍රකාරව, 2014 වර්ෂය සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශන ඔබතුමා වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,

මහාචාර්ය කේ.බී. පලිපාන
සභාපති
පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

## පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය
## අධ්‍යක්ෂ මණ්ඩලය

| නම | තනතුර | පැමිණීම |
|---|---|---|
| ජගත් පාලිත ජයවර්ණ මහතා | සභාපති | දින 10 |
| නිතීඥ ගුණරත්න ගාල්ලගේ මහතා | උප සභාපති | දින 10 |
| ආචාර්ය නිමල් දිසානායක මහතා | අධ්‍යක්ෂ | දින 08 |
| පාලිත ගොඩගමගේ මහතා | අධ්‍යක්ෂ | දින 10 |
| එන්.ජී.සමීර හෙට්ටිආරච්චි මහතා | අධ්‍යක්ෂ | දින 10 |
| එම්.ඒ.කරුණාරත්න මහතා | අධ්‍යක්ෂ | දින 10 |
| ඩබ්ලිව්.එම්. සුනිල් ශාන්ත මහතා | අධ්‍යක්ෂ | දින 07 |

වර්ෂය තුළ පහත දිනවලදී රැස්වීම් පවත්වා ඇත.
2014.01.30, 2014.02.25, 2014.04.29, 2014.05.27, 2014.07.18, 2014.08.26, 2014.09.30,
2014.10.28, 2014.11.25

## විගණන සහ කළමනාකරණ කමිටුව

| නම | තනතුර | පැමිණීම |
|---|---|---|
| එම්.ඒ.කරුණාරත්න මහතා | ප.අ.තා.ආ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි (සභාපති, විගණන සහ කළමනාකරණ කමිටුව) නියෝජ්‍ය අධ්‍යක්ෂ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය | දින 04 |
| ගුණරත්න ගාල්ලගේ මහතා | උප සභාපති, ප.අ.තා.ආ. | දින 04 |
| ආචාර්ය බී.එම්.කේ.එස්. තිලකරත්න මිය | අධ්‍යක්ෂ - ප.අ.තා.ආ. | දින 04 |
| ඩී.පී.සී. ස්වර්ණසිරි මහතා | අතිරේක අධ්‍යක්ෂ (පර්යේෂණ සහ තාක්ෂණ ප්‍රචාරණ) | දින 02 |
| ආර්.කේ.ඒ.පී. රාමනායක මහතා | අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මුදල්) -ප.අ.තා.ආ. | දින 04 |
| අයි.එම්.එන්.පී. ඉලන්ගසිංහ මහතා | ගණකාධිකාරී - ප.අ.තා.ආ. | දින 04 |
| ආර්.එම්.ඩී. රත්නායක මහතා | අභ්‍යන්තර විගණක - ප.අ.තා.ආ. කැඳවුම්කරු, විගණන සහ කළමනාකරණ කමිටුව | දින 04 |
| ජේ.ඒ.එස්. ධම්මික පෙරේරා මහතා | නිරීක්ෂක, විගණන සහ කළමනාකරණ කමිටුව සහකාර විගණන අධ්‍යක්ෂ, විගණකාධිපති දෙපාර්තමේන්තුව | දින 04 |
| ඩබ්ලිව්.කේ.එල්.ඊ. වලල්ලාවිට මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක කෘෂිකර්ම අමාත්‍යාංශය නිරීක්ෂක, විගණන සහ කළමනාකරණ කමිටුව | දින 04 |

වර්ෂය තුළ පහත දිනවලදී රැස්වීම් පවත්වා ඇත.
2014.03.31, 2014.08.27, 2014.10.29, 2014.12.17

## අපගේ දැක්ම

පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දකුණු ආසියාවේ විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය වීම

## අපගේ මෙහෙවර

පසු අස්වනු පර්යේෂණ සහ සංවර්ධනය තුලින් ඵලදායීතාවය ඉහළ නැංවීම සහ කෘෂි ව්‍යාපාර ක්ෂේත්‍රයේ තරඟකාරීත්වය සඳහා පහසුකම් සැපයීම.

# පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

## වාර්ෂික වාර්තාව - 2014

## 1. සමාලෝචනය

කෘෂිකාර්මික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය (ප.අ.තා.ආ.) ධාන්‍ය, මාශ බෝග, තෙල් බෝග, අනෙකුත් ක්ෂේත්‍ර බෝග, පලතුරු, එළවළු සහ කුළු බඩු බෝග සම්බන්ධයෙන් පසු අස්වනු තාක්ෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතෙහි ප්‍රතිපාදනයන් යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1137/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් 2000 වර්ෂයේ ජුනි 19 වැනි දින පිහිටුවා ඇත. FAO/UNDP (ආහාර හා කෘෂිකර්ම සංවිධානය/එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ) සහයෝගීතාවය සමගින් 1976 වර්ෂයේ පිහිටුවන ලද වී අළෙවි මණ්ඩලයෙහි සහල් සැකසුම් පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රයෙහි (RPRDC) කාර්යයන් පවරා ගෙන ඇත. සියලු ක්ෂේත්‍රයන්හි බෝග සහ අස්වනු පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්, එනම්, අස්වනු නෙළීම, ගබඩා කිරීම සහ සංරක්ෂණය, ප්‍රාථමික සහ ද්විතීයික සැකසුම්, නිෂ්පාදන සංවර්ධන, තත්ත්ව සහතික සහ අතුරුඵල ප්‍රයෝජනයට ගැනීම සිදු කරනු ලබන ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානතම ආයතනය ලෙස මෙම ආයතනය පිළිගැනේ.

*ආයතනයෙහි අරමුණු*

ගැසට් නිවේදනය මගින් ලබා දී ඇති බලතල අනුව, ශ්‍රී ලංකාවේ පශ්චාත් අස්වනු තාක්ෂණ සංවර්ධනය සඳහා පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීමේ සහ ප්‍රමුඛත්වය ලබා දීමේ අභිමතාර්ථයෙන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නියෝජිතායන සමූහනය කිරීමේ සම්බන්ධීකාරක වශයෙන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය ක්‍රියාකාරී වෙතැයි අපේක්ෂා කෙරේ. කල් තබා ගත නොහැකි සහ කල් තබා ගත හැකි ආහාර බෝගයන්හි පසු අස්වනු තාක්ෂණය සම්බන්ධයෙන් පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් මෙහෙයවීම තුළින් ආයතනය පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගත යුතු වේ.

අ) වැඩිදියුණු කළ, පිරිවැය ඵලදායි තාක්ෂණවේදයන් හඳුන්වා දීම තුළින් ධාන්‍ය, ක්ෂේත්‍ර බෝග, පලතුරු, එළවළු සහ කුළුබඩු බෝගයන්හි පසු අස්වනු හානි වැළැක්වීම මගින් ඔවුන්ගේ අළෙවි අතිරික්තය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය වගා අංශයෙහි ආදායම් වැඩි වනු ඇත. ජාතික මට්ටමේදී එවැනි වැඩ පිළිවෙළක් මගින් පරිභෝජනය සහ අවශ්‍ය ආහාර ද්‍රව්‍යයන්හි ප්‍රමාණාත්මක ඉහළ යෑමක් ඇති වනු ඇත.

ආ) අවිධිමත් පසු අස්වනු පරිහරණය කිරීමේ, ගබඩා කිරීමේ සහ සැකසීමේ ක්‍රමවේදයන් යොදා ගැනීම හේතුවෙන් ධාන්‍ය, ක්ෂේත්‍ර බෝග, පළතුරු, එළවළු සහ කුළුබඩු බෝගයන්හි සිදු වන තත්ත්ව හානිය වැළැක්වීම තුලින් වෙළඳපළ කරා ලඟා වන මෙම අත්‍යවශ්‍ය වෙළඳ ද්‍රව්‍යයන්හි තත්ත්වය සැලකිය යුතු ලෙස ඉහළ නැංවේ. නිෂ්පාදනයෙහි තත්ත්වය වැඩි දියුණු වීම තුලින් ඔවුන්ගේ අගය එක් කල නිෂ්පාදන තරඟකාරී වෙළඳපළ තුල වඩාත් වැඩි මිලකට අළෙවි කර ගැනීමට හැකි වීමෙන් කෘෂිකර්මාන්තයෙන් ඔවුන් උපයන ආදායම ඉහළ නංවා ගත හැකි වනු ඇත.

ඇ) අවිධිමත් පසු අස්වනු ක්‍රමවේද යොදා ගැනීම තුළින් ධාන්‍ය, මාශබෝග සහ අනෙකුත් ආහාර බෝග, පලතුරු, එළවළු සහ කුළුබඩු බෝගයන්හි සිදු වන පෝෂණ හානිය වැළැක්වීම සහ එමගින් දිවයිනෙහි පෝෂණ තත්ත්වයන් ඉහළ නැංවීම.

ඈ) අවාරයේදී වඩාත් වාසි සහගත මිල ගණන්වලට ගොවීන්ගේ නිෂ්පාදනයන් විකිණීම තුළින් ඔවුන්ගේ ආදායම් ඉහළ නැංවීම සඳහා ගොවිපළ මට්ටමේ ගබඩා සහ සංරක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම.

ඉ) කෘෂි පාරිභෝගික ද්‍රව්‍යයන්හි නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා අවම ශ්‍රමයක් යොදා ගන්නා වැඩිදියුණු කළ පසු අස්වනු තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම.

ඊ) ග්‍රාමීය වගා අංශයෙහි ආදායම් ඉහළ නැංවීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ග්‍රාමීය මට්ටමින් කෘෂි-පදනම් කර්මාන්ත ව්‍යාප්ත කොට ප්‍රවර්ධනය කිරීම.

උ) දේශීය ධාන්‍ය නිෂ්පාදනය සඳහා ඉහළ අළෙවි ඉල්ලුමක් ඇති කිරීම පිණිස ධාන්‍ය, මාශ බෝග, පලතුරු, එළවළු සහ කුළුබඩු බෝගවලින් සකස් කරන ආහාර පාරිභෝගිකයින් අතර ජනප්‍රිය කරවීම. ඉහළ පෝෂණ වටිනාකමක් සහිත මෙම ආහාර පරිභෝජනය ඉහළ යාම දිවයිනෙහි පෝෂණ තත්ත්වය වැඩිදියුණු වීමටද හේතු වනු ඇත.

## *1. ප.අ.පි.තා.ආ. ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය.*

### *පර්යේෂණ ක්‍රියාකාරකම්*

2014 වර්ෂයේ පර්යේෂණ වැඩසටහනට අනුව, මූලික සහ ව්‍යවහාරික පර්යේෂණ යන දෙවර්ගයම, ඇතුළුව ආයතනයේ පර්යේෂණ ක්‍රියාකාරකම් පසු අස්වනු කර්මාන්තය මුහුණ දෙමින් පවතින තාක්ෂණික ගැටලු විසඳීම සඳහා අඛණ්ඩව සිදු කරන ලද අතර මින් ප්‍රමුඛත්වය ව්‍යවහාරික පර්යේෂණ වලට ලැබී තිබිණි. 2014 වර්ෂය තුළදී පර්යේෂණ ව්‍යාපෘති විස්සක් (20) ක් සිදු කර ඇති අතර එය 2013 වර්ෂයේ සිට සිදු කරගෙන එනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘති හතකින් (07) සහ 2014 වර්ෂයේ ආරම්භ කරන ලද පර්යේෂණ ව්යාපෘති නවයකින් (09) සමන්විත වේ. ව්‍යාපෘති හතරක් (04) ක් සඳහා පෞද්ගලික අංශ අරමුදල් සැපයිණි.

### පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය-2014

සමාලෝචිත වර්ෂය තුළදී ප.අ.තා.ආ. සැළකිය යුතු ජයග්‍රහණයක් වන්නේ පසු අස්වනු තාක්ෂණය පිළිබඳ පළමු අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය 2014 ජුනි මස 19 වැනි දින ප.අ.තා.ආ. දී පැවැත්වීමට හැකි වීමයි. කෘෂිකර්ම අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා වූ අතර එක්සත් රාජධානියේ රීඩින් විශ්ව විද්‍යාලයේ ආහාර ජෛව සැකසුම් පිළිබඳ මහාචාර්ය සහ ආහාර ඉංජිනේරු විද්‍යා ජර්නලයේ සංස්කාරක ආචාර්ය කේෂවන් නිරන්ජන් මහතා විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ආර්.එම්.ඩී.බී.මීගස්මුල්ල මහතා සහ පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ සභාපති ජගත් පාලිත ජයවර්ණ මහතාද සම්මන්ත්‍රණය අමතන ලද අතර ප.අ.තා.ආ. අධ්‍යක්ෂ ආචාර්ය බී.එම්.කේ.එස්.තිලකරත්න මහත්මිය ආයතනය සම්බන්ධයෙන් සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී. අතිරේක අධ්‍යක්ෂ (පර්යේෂණ සහ තාක්ෂණ පැවරුම්) ඩී.පී.සී. ස්වර්ණසිරි මහතා විසින් ස්තුති කථාව සිදු කළේය. ශ්‍රී ලංකාවෙන් සහ වෙනත් රටවලින් සහභාගී වූ පර්යේෂකයින් 30 දෙනෙකු පමණ ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කරන ලදී.

මීට අමතරව එහි වැඩිදියුණුව සඳහා පසු අස්වනු අංශය තුළ මෙම සොයාගැනීම් ව්‍යාප්ත කිරීම සඳහා මෙම පර්යේෂණ සොයාගැනීම් ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ කාර්ය සටහන්වල, විවිධ විශ්වවිද්‍යාල විසින් පවත්වන ලද සම්මන්ත්‍රණවල සහ අන්තර්ජාතික ජර්නලවල ප්‍රසිද්ධියට පත් කර ඇත. 2013 වර්ෂයේ සිට සිදු කරගෙන එනු ලැබූ පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේ විවිධ කාර්තු තුළ සිදු කර සම්පූර්ණ කර ඇත.

### 2013 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති

**a)** වී තොග ගබඩා කිරීම සඳහා ධාන්‍ය ගබඩා පද්ධති ඇගයීම.

**b)** ධාන්‍ය සහ තෙල් භෝග ගබඩාකරණය සඳහා භාවිත ක්‍රමවේද වල සහ ධාන්‍ය බිස්සෙහි වායුරෝධන තත්ත්ව වල බලපෑම ඇගයීම.

**c)** එළවළු සහ පළතුරු විජලනය කිරීමේ සහ අධිශීත කිරීමේ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

**d)** පිටි කල සහල් ආශ්‍රිත නිෂ්පාදන සම්පාදනය කිරීම සහ ජනප්‍රිය කරවීම.

**e)** නිර්මාංශ ලිංගුස් සකස් කිරීම.

- **f)** ශ්‍රී ලංකාවේ සහල් මෝල් කර්මාන්තයේ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- **g)** සහල් සැකසීමේ කර්මාන්තයේ අප ජල කළමනාකරණය කිරීම.
- **h)** නිදන්ගත වකුගඩු රෝගය පැතිර පවතින ප්‍රදේශ වල ජනතාවගේ ආහාර සහ ආහාර පුරුදු පිළිබඳව සමීක්ෂණය කිරීම.
- **i)** වී අස්වනු නෙළීම සඳහා භාවිතා කරනු ලබන සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍රවලින් සිදු වන හානි ඇගයීම.

**2014 වර්ෂයේ නව ව්‍යාපෘති**

a) අඹ, ගස්ලබු සහ අන්නාසි සඳහා ප.අ.තා.ආ. පල්ප නිස්සාරකයක් ඇගයීම.
b) 1-MCP (මීතයිල්සයික්ලොප්‍රොපේන්) යොදා ගැනීම තුළින් ඇඹුල් කෙසෙල්වල පසු අස්වනු ජීව කාලය ඇගයීම.
c) ප්‍රධාන වී නිෂ්පාදන කලාපයන්හි වර්තමාන ධාන්‍ය ගබඩා තත්ත්වයන්.
d) කුරහන්වල ගල් ඉවත් කිරීමේ යන්ත්‍රයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම.
e) වී පෙහවීමේදී දහයියා ඉවත් කිරීම යාන්ත්‍රීකරණය කිරීම.
f) මී ඇට සහ රටකජු සඳහා ඉස්කුරුප්පු ආකාරයේ තෙල් නිස්සාරකයක කාර්ය සාධනය ඇගයීම.
g) ශ්‍රී ලංකාවේ අඹ පසු අස්වනු හා සම්බන්ධිත ගැටලු හඳුනාගැනීම සඳහා සමීක්ෂණය.

*පෞද්ගලික අරමුදල් ලැබූ ව්‍යාපෘති*

- *a)* *අඩු වියදම් ධාන්‍ය පිටි මිශ්‍ර කිරීමේ උපකරණයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම.*
- *b)* *ශ්‍රී ලාංකික තත්ත්ව යටතේ ගබඩා පළිබෝධකයින් මත කෘමිනාශක යෙදූ බෑගවල ජෛව සඵලත්වය.*
- *c)* *පරිභෝජනය සඳහා සූදානම් පළතුරු සලාදයක පසු අස්වනු ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා එහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.*
- *d)* *අලුතින් නෙලාගත් වී වියළීම සඳහා ජංගම වියළීමේ යන්ත්‍රයක් සකස් කිරීම.*

*තාක්ෂණ ව්‍යාප්තිය*

ආයතනය මගින් සංවර්ධිත පශ්චාත් අස්වනු තාක්ෂණයන් ඵලදායීව ව්‍යාප්ත කිරීම සඳහා, 2014 වර්ෂය තුළ ප.අ.තා.ආ. විසින් පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති දිවයින පුරා සිදු කර ඇත.මෙම ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයා ඇත.

- a) පැසල් ළමුන් අතර සහල් ආශ්‍රිත නිෂ්පාදන ජනප්‍රිය කරවීම සඳහා පාසල් ආපනශාලා හිමියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- b) උසස් තත්ත්වයේ සහල් මිලදී ගැනීම සහ පරිභෝජනය කිරීම ඉහළ නැංවීම සඳහා සහල් වෙළඳසැල් සංවර්ධනය කිරීම.
- c) උසස් තත්ත්වයේ සහල් නිෂ්පාදනය කිරීම සඳහා සහල් මෝල් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම.
- d) සහල් ආශ්‍රිත නිපැයුම් නිෂ්පාදනය කිරීමේ ක්ෂුද්‍ර ව්‍යවසායන් ආරම්භ කිරීම.
- e) සහල් පිටි කෙටීමේ කර්මාන්ත වැඩිදියුණු කිරීම.
- f) ආහාර සුරක්ෂිතතාව සඳහා ග්‍රාමීය මට්ටමින් ධාන්‍ය ගබඩාකරණය.
- g) ශ්‍රී ලංකාවේ කුළු බඩු සැකසීමේ කර්මාන්තශාලා සංවර්ධනය කිරීම.
- h) ග්‍රාමීය මට්ටමින් පළතුරු ආශ්‍රිත නිපැයුම් නිෂ්පාදනය කිරීමේ ක්ෂුද්‍ර ව්‍යවසායන් ආරම්භ කිරීම
- i) තල සඳහා තෙල් නිස්සාරණය පිළිබඳ තාක්ෂණ පැවරීම.
- j) ගෘහ විද්‍යා ගුරුවරියන් සහ ශිෂ්‍යාවන් සඳහා දේශීය ආහාර ජනප්‍රිය කරවීම පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- k) පලතුරුවල පසු අස්වනු ජීව කාලය ඉහළ නැංවීම සහ පළතුරු වෙළඳසැල් නවීකරණය කිරීම.

### පුහුණු ක්‍රියාකාරකම්

ප.අ.තා.ආ. පුහුණු ක්‍රියාකාරකම් නිෂ්පාදනය/ව්‍යාප්තිය දිශානත වන අතර, ධාන්‍ය, අල සහ බල්බ, පළතුරු සහ එළවළු වර්ගයන්හි පසු අස්වනු තාක්ෂණ ක්ෂේත්‍රයේ නියැලි රාජ්‍ය සහ පෞද්ගලික අංශ නියෝජිතායතනයන්හි නිෂ්පාදකයින්, සැකසුම්කරුවන්, වෙළඳ ව්‍යාපාරිකයන් සහ ව්‍යාප්ති සේවකයින්ගේ දැනුම ඉහළ නැංවීම උදෙසා ඉලක්ක කර ඇත. කෙසේවෙතත්, සීමිත ප්‍රමාණයකට විශ්වවිද්‍යාල සහ අනෙකුත් ශාස්ත්‍රීය ආයතන සිසුන් සඳහා පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ අත්දැකීම් ලබාදෙමින් පර්යේෂණ දිශානත පාඨමාලා ද පවත්වා ඇත. 2014 වර්ෂය තුළදී ප.අ.තා.ආ.හි පුහුණු කටයුතු සඳහා ඉල්ලුම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යයන චාරිකා ද ඇතුළත්ව නේවාසික පුහුණු පාඨමාලා 53 ක් පවත්වා ඇති අතර පුද්ගලයින් 1808 ක් පුහුණු කර ඇත. අනේවාසික පාඨමාලා 18 ක් පවත්වා 1901 දෙනෙකු පුහුණු කර ඇත. ක්ෂේත්‍ර මධ්‍යස්ථාන වලදී අනේවාසික පාඨමාලා 245 ක් පවත්වා 8915 දෙනෙකු පුහුණු කර ඇත.

### ව්‍යාප්ති ක්‍රියාකාරකම්

2012 වර්ෂය තුළදී ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකමක් වන ක්ෂේත්‍ර මට්ටමින් තාක්ෂණය ව්‍යාප්ත කිරීමේ කාර්ය කරගෙන ගොස් ඇත. ගොවි මහතුන්, පළතුරු සහ එළවළු එක් රැස් කරන්නන් සහ වෙළඳ මහතුන් විශාල සංඛ්‍යාවකට ඵලදායී ව්‍යාප්ති ක්‍රියාකාරකම් ලබා දීම පිණිස දිවයින පුරා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන 10ක් පිහිටුවන ලදී. මෙම වැඩසටහන යටතේ අනුරාධපුර, අම්පාර, පොළොන්නරුව, නුවරඑළිය, මහනුවර, ලුනාම (හම්බන්තොට), ගාල්ල, අඹන්පොළ (කුරුණෑගල), මාතර සහ යාපනය ක්ෂේත්‍ර මධ්‍යස්ථාන පිහිටුවා ඇත.

අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි ව්‍යාප්ති ක්‍රියාකාරකම් අම්පාර ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරකම් ලුනාම ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද, නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කයන් නුවරඑළිය ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද, මහනුවර දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරකම් මහනුවර ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද, ගාල්ල දිස්ත්‍රික්කය ගාල්ල ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද, කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කය අඹන්පොළ ක්ෂේත්ත්‍ර මධ්‍යස්ථානය මගින්ද, මාතර දිස්ත්‍රික්කය මාතර ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද වව්නියාව, මන්නාරම සහ ත්‍රිකුණාමලය, මඩකලපුව, යාපනය සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක වල ක්‍රියාකාරකම් යාපනය ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද ආවරණය කෙරිණි.පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ව්‍යාප්ති ක්‍රියාකාරකම් පොළොන්නරුව ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මඟින් ද අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරකම් අනුරාධපුර පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ තාක්ෂණ ප්‍රචාරණ අංශය මගින් සිදුකෙරේ. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී ප.අ.තා.ආ.යේ ව්‍යාප්ති වැඩසටහන් යටතේ ගොවි මහතුන් රාජ්‍ය සහ පෞද්ගලික ආයතනයන්හි, සැකසුම්කරුවන්, වෙළෙන්දන්, ව්‍යාප්ති සේවකයින් 8915ක් පුහුණු කර ඇත.

### උපදේශන සහ උපදේශක සේවාවන්

ඍජුව හා වක්‍රව පසු අස්වනු ක්‍රියාකාරකම්හි නියැලෙන රාජ්‍ය හා පෞද්ගලික අංශ ආයතන මෙන්ම සමුපකාර අංශය මගින් ප.අ.තා.ආ.යෙහි උපදේශන සහ උපදේශක සේවාවන් වඩ වඩාත් බලාපොරොත්තු වේ. මෙම සේවාවන් සැපයීම මගින්, නව සැකසුම් යන්ත්‍රාගාර කිහිපයක් පිහිටුවීම, පවතින යන්ත්‍රාගාර නවීකරණය කිරීම සහ සහල් මෝල හිමියන්ගේ සහ ආහාර සැකසුම්කරුවන්ගේ එදිනෙදා මෙහෙයුම් ගැටළු විසඳීම සඳහා උපදේශන 122ක් සැපයීමට ආයතනය සමත් වී ඇත.

### තත්ත්ව පරීක්ෂාව

රාජ්‍ය සහ පෞද්ගලික ආයතන මගින් ඔවුන්ගේ භෞතික හා රසායනික තත්ත්ව පරීක්ෂාව සඳහා ලැබෙන නියැදි විශ්ලේෂණය තුළින් දිවයිනෙහි කෘෂි/ආහාර නිෂ්පාදනයන්හි තත්ත්ව පාලනය පවත්වා ගැනීම සඳහා ආයතනය වැදගත් කාර්ය භාරයක් ඉටු කර ඇත. සමාලෝචිත කාල පරිච්ඡේදයේදී ආයතනය විසින් නියැදි 16ක් විශ්ලේෂණය කර ඇත.

*ප්‍රකාශන*

2014 වර්ෂය තුළදී ප.අ.තා.ආ.හි ක්‍රියාකාරකම් සහ නව තාක්ෂණයන් ප්‍රසිද්ධ කිරීම සඳහා ව්‍යාප්ති පත්‍රිකා සහ අත් පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම සිදු කරගෙන ගොස් ඇත. මේ සඳහා ව්‍යාප්ති පත්‍රිකා සහ අත් පත්‍රිකා 25,680ක් පුහුණුවන්නන් සහ උනන්දුවක් දක්වන්නන් අතර බෙදා දී ඇත.

*ආයතනික සංවර්ධනය*

එහි අරමුණු සහ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්, එනම් පසු අස්වනු තාක්ෂණයෙහි පර්යේෂණ, පුහුණුව, ව්‍යාප්තිය, උපදේශන/අනුශාසන සහ වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කරන අතරම සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී පර්යේෂණ සහ සංවර්ධනය සඳහා යටිතල පහසුකම් 02ක් වැඩිදියුණු කරන ලදී.

*සාරාංශය*

මෙම වාර්තාව 2014 වර්ෂය තුළ ප.අ.තා.ආ. ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් වන අතර, පසු අස්වනු තාක්ෂණ විෂය පිළිබඳව සැලකිල්ලක් දක්වන පුද්ගලයින්ගේ උනන්දුව ඇති කිරීම සඳහා එය බැදී සිටී.

## 2. පර්යේෂණ ක්‍රියාකාරකම් වල විශේෂතා

ප.අ.තා.ආ.හි ප්‍රධාන ක්‍රියාකාරකම වන පර්යේෂණ, පසු අස්වනු කර්මාන්තය මුහුණ දෙන තාක්ෂණික ගැටළු විසඳීම කරා මෙහෙයවා ඇත.

2014 වර්ෂය තුළදී ප.අ.තා.ආ. මගින් මෙහෙයවන ලද පර්යේෂණ වැඩසටහන්හි විශේෂතා සමහරක් පහත දක්වා ඇත.

### 2.1 සම්පූර්ණ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති

#### 2.1.1. භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

#### 2.1.1.1 ධාන්‍ය සහ මාංශ බෝගයන්හි පසු අස්වනු තාක්ෂණය

**a) ක්ෂණික සහල් නූඩ්ල්ස් සකස් කිරීම සහ තත්ත්වය ඇගයීම (cup noodle)**

නූඩ්ල්ස් ලෝව පුරා බහුලව පරිභෝජනය කරනු ලබන ප්‍රධාන ආහාරවලින් එකක් වන අතර එහි ගෝලීය පරිභෝජන දෙවැනි වන්නේ පාන් වලට පමණි. ක්ෂණික නූඩ්ල්ස් වෙළඳපොළ ආසියානු රටවල ශීඝ්‍රයෙන් වර්ධනය වන අතර යුරෝපීය වෙළඳපොළ ජනප්‍රියත්වය අත්පත් කර ගනිමින් සිටී. ක්ෂණික නූඩ්ල්ස් නිෂ්පාදනය කිරීම සඳහා සාමාන්‍යයෙන් භාවිතා කරනු ලබන තිරිඟු පිටි ඇමයිනෝ අම්ල ලයිසින්වලින් පොහොසත් නොවේ. ශ්‍රී ලංකා වෙළඳපොළේ ක්ෂණික සහල් නූඩ්ල්ස් සුළු සංඛ්‍යාවක් පැවතියද ඒ පරිභෝජනය කිරීමට සූදානම් කප් නූඩ්ල්ස් ආකාරයෙන් නොවේ. වැඩිපුර වී නිෂ්පාදනය හේතුවෙන් පසුගිය වර්ෂ කිහිපය තුළදී ශ්‍රී ලංකාවේ සහල් ස්වයං- ප්‍රමාණවත් අනුපාතිකය ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකාවේ අතිරේක වී අස්වැන්න භාවිතයට ගැනීම සඳහා උපකාරී වන ක්ෂණික

කප් නූඩ්ල්ස් වැනි සහල් ආශ්‍රිත නව්‍ය ආහාර අයිතම හඳුන්වාදීම වැදගත් වේ. උතුරන ජලය පමණක් එකතු කිරීමෙන් විනාඩි 3ක් තුළ සකස් කර ගත හැකි වීම හේතුවෙන් කාර්ය බහුල ජීවන රටාවක් සහිත ජනතාව සඳහා පෝෂණ ගුණයෙන් සපිරි උදේ ආහාරයක් ලබා ගැනීමට ක්ෂණික සහල් නූඩ්ල්ස් වඩාත් හොඳ විසඳුමක් වනු ඇත. රස සහ සුවඳ ඇගයීමේදි 5.00 කින් 4.83ක් ලෙස මෙම නිෂ්පාදනය පිළිගතහැකි මට්ටමක පවතින බවත් පිසීමේ හානිය 10.18%ක් වන බවත් මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය.

**b) සහල් පිටි ආශ්‍රිත ගැඹුරු තෙලේ බදින ලද විස්කෝතුවක් සකස් කිරීම සහ එහි ගබඩාකර තබාගැනීමේ හැකියාව අධ්‍යයනය කිරීම**

ශ්‍රී ලංකාවේ වාණිජ ආහාර සකස් කිරීමේ කර්මාන්තයෙහි සහල් පිටි යොදාගැනීම නිෂ්පාදන කිහිපයක් සඳහා සීමා වී ඇත. එබැවින් මෙම පර්යේෂණයේ අරමුණ වූයේ සහල් පිටි ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් ගැඹුරු තෙලේ බදින ලද විස්කොතුවක් සකස් කිරීම සහ එම නිෂ්පාදනයෙහි රාක්ක ජීව කාල ස්ථායිතාවය ඇගයීමයි.

සහල් විස්කෝතුව සඳහා ප්‍රශස්ත මිශ්‍රණයක් නිශ්චය කිරීම සඳහා සහ විස්කෝතු නිෂ්පාදන ක්‍රියාවලියක් සකස් කිරීම සඳහා මූලික අධ්‍යයන සිදු කරන ලදී. සහල් පිටි (85%) ක්, තිරිඟු පිටි (5%), බඩ ඉරිඟු පිටි (10%), කාබොක්සිමීතයිල් සෙලියුලෝස් (1%)ක්, ලුණු (2%)ක්, ගම්මිරිස් (1%)ක්, සීනි(2%)ක් සහ පොල්තෙල් (5%)ක් අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් උසස් මට්ටමේ රස, සුවඳ සහිත විස්කෝතුවක් නිෂ්පාදනය කරන ලදී. ඉහත මිශ්‍රණය යොදා සකස් කල පිටි මෝලිය සෙ.මී.1ක ඝනකමකට තුනී කර සෙන්ටිග්‍රේඩ් අංශක 95-98 උෂ්ණත්වයකින් යුත් වාෂ්පයෙන් මිනිත්තු 45 ක් තම්බා ගන්නා ලදී. පසුව කාමර උෂ්ණත්වයට නිවෙන්නට හැර සෙන්ටිග්‍රේඩ් අංශක 5ක උෂ්ණත්වයක් යටතේ පැය 10ක කාලයක් ශීතකරණයක තබන ලදී. ඉන් පසු මි.මී. 25X12X1.5 ප්‍රමාණයේ කැබලිවලට වෙන් කර සෙන්ටිග්‍රේඩ් අංශක 55 උෂ්ණත්වයක පැය 3ක කාලයක් උඳුනක තබා වියළා සෙන්ටිග්‍රේඩ් අංශක 220ක උෂ්ණත්වයකින් යුත් ගැඹුරු තෙලේ තත්පර 5ක කාලයක් බදින ලදී.

නිෂ්පාදනය ගබඩාකර තබා ගැනීමේ හැකියාව, වර්ග දෙකක ඇසුරුම් ද්‍රව්‍යය (පොලිප්‍රොපලීන් සහ ඔරියන්ටඩ් පොලිප්‍රොපලීන්/ලෝහ ආලේපිත කාස්ට් පොලිප්‍රොපලීන් ලැමිනේට් කල කවර) සමඟ වායුගෝල තත්ත්ව (සෙන්ටිග්‍රේඩ් 31±3, සාපේක්ෂ ආර්ද්‍රතාව 70±5%) යටතේ පරීක්ෂා කරන ලදී. ගබඩාකරණ කාලපරිච්ඡේදය තුළදී නියදිවල භෞතික-රසායනික, ක්ෂුද්‍රජීව විද්‍යාත්මක, සහ සංවේදක ගුණ මාසිකව මාස තුනක් දක්වා පරීක්ෂා කරන ලදී. සහල් පිටි ප්‍රධාන අමුද්‍රව්‍යය ලෙස යොදා ගනිමින් ගැඹුරු තෙලේ බදින ලද විස්කෝතුවක් සකස් කර ගත හැකි බවත් ඔරියන්ටඩ් පොලිප්‍රොපලීන්/ලෝහ ආලේපිත කාස්ට් පොලිප්‍රොපලීන් ලැමිනේට් කල ඇසුරුම් ද්‍රව්‍යවල සංවේදක ගුණ නොනැසී මාස තුනකට වඩා වැඩි කාලයක් ගබඩා කර තබා ගත හැකි බවත් අධ්‍යයනයෙන් අනාවරණය විය.

**c) සහල් ආශ්‍රිත තෙරපුම් කල (extruded) නිෂ්පාදන සම්පාදනය කිරීම සහ ජනප්‍රිය කරවීම.**

1950 අවසන් භාගයේදී ආහාර සහ සංග්‍රහ සඳහා තෙරපුම් (Extrusion) පිසීම මුලින්ම හඳුන්වාදෙන ලදී. එතැන් සිට ඒ හා සමබන්ධිත පද්ධතිය ජනප්‍රියතාවයෙන්, කාර්යක්ෂමතාවයෙන් සහ නම්‍යතාවයෙන් වර්ධනය වී ඇත. තෙරපුම් පිසීමේ තාක්ෂණය ආහාර කර්මාන්තයේ ධාන්‍ය සහ ප්‍රෝටීන සැකසීමේදී බහුලව භාවිතා කරනු ලබන අතර එය සුරතල් සතුන්ගේ කෑම සහ සංග්‍රහ ක්ෂේත්‍රවලට වඩාත් අදාලවේ. (Caroline et.al, 2012). බහු අදියර, බහු ක්‍රියාකාරී සහ තාප/යාන්ත්‍රික ක්‍රියාවලියක් ලෙස තෙරපුම් පිසීම, ආහාර සකස් කිරීම් විශාල සංඛ්‍යාවක් සඳහා අනුමත කර ඇත. පෝෂණ තත්ත්වය මත තෙරපුම් පිසීමේ බලපෑම නොපැහිදිලිය. ප්‍රයෝජනවත් ප්‍රතිලාභ වලට ප්‍රති-පෝෂණ සාධක විනාශ වීම, පිෂ්ටය ජෙලටිනීකරණය වීම සහ ද්‍රාව්‍ය ආහාරමය තන්තු වැඩි වීම සහ ලිපිඩ ඔක්සිකරණය වීම අඩු විම ඇතුලත් වේ. අනෙක් අතට, අමුද්‍රව්‍ය වර්ග, ඒවායේ සංයුතිය සහ සකස් කිරීමේ තත්ත්වයන් මත රඳාපවතිමින් ප්‍රෝටීන සහ සීනි අතර මිලාඩ් ප්‍රතික්‍රියා ප්‍රෝටීනවල පෝෂණීය වටිනාකම අඩු කරනු ලබයි. තාප-අස්ථායී ප්‍රෝටීන විවිධ ප්‍රමාණයන්ගෙන් විනාශ විය හැකිය, ප්‍රෝටීන සහ ඇමයිනෝ අම්ල ආකෘතිය, කාබෝහයිඩ්‍රේට, ආහාරමය තන්තු, විටමින, ඛනිජලවණ ප්‍රමාණය සහ සමහර පෝෂණ නොවන සෞඛ්‍යමය සංඝටකවල වෙනස්වීම ඵලදායක හෝ අවැඩදායක විය හැක. (Shivendra,2006). ක්ෂණික ආහාර පරිභෝජනය අඩු කිරීම සඳහා සහ ජනතාවගේ පෝෂණය සහ සෞඛ්‍යමය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සහල් ආශ්‍රිත තෙරපුම් නිෂ්පාදන, විජලනය කරන ලද එළවළු, ප්‍රරෝහිත මාශභෝග ආදිය සමඟින් ජනප්‍රිය කරවීම ශ්‍රී ලාංකික වෙළඳපොළ තුළ නව ප්‍ර වේශයක් බව පත්ව ඇත.

තෝරාගත් අමුද්‍රව්‍ය, ප්‍රධාන අමුද්‍රව්‍යය වන සහල් ශක්ති ප්‍රභවයක් ලෙස අවශ්‍ය කාබෝහයිඩ්‍රේට ප්‍රමාණය ලබා දේ. රනිලභෝගවල ප්‍රරෝහණය හෝ මෝල්ට්වීම ඛනිජලවණ පැවතීම ඉහළ නංවා ප්‍රති-පෝෂණ සාධක අඩු කරන අතර සමහර විටමින ප්‍රමාණය වැඩි කර සමස්ත පෝෂණ වටිනාකම ඉහළ නංවනු ලැබේ. රතු කව්පි ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරාලන අතර රටකජු බහුඅසංතෘප්ත ලිපිඩ ප්‍රභවයක් ලෙස ක්‍රියා කරනු ලැබේ. එළවළු කුඩු ඛනිජලවණ සහ විටමින ප්‍රභවය ලෙස ක්‍රියා කරනු ලැබේ. ඉහත සංඝටක හේතුවෙන් අවසානයේදී එය ළදරුවන් සහ ළමුන් සඳහා සමබල ආහාරයක් බවට පත් වී ඇත. සහල් වලින් නිස්සාරිත අයිතම නිෂ්පාදනය කිරීම සහ නව නිෂ්පාදන ශ්‍රී ලංකාවට හඳුන්වාදීමට මෙම ව්‍යාපෘතියෙන් අරමුණු කෙරිණි.



**d) කුරහන්වල ගල් ඉවත් කරන යන්ත්‍රයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම**

පෝෂණ ද්‍රව්‍ය විශාල ප්‍රමාණයකින් සමන්විතවීම හේතුවෙන් අතීතයේදී මෙන්ම වර්තමානයේදීද කුරහන්, මනුෂ්‍යයන්ගේ වඩාත් වැදගත් ආහාරයකි. එමෙන්ම බොහොමයක් දියවැඩියා රෝගීන් සඳහා කුරහන් අඩංගු ආහාරයක් ගැනීම නිර්දේශ කරන බැවින් කුරහන් සඳහා වර්තමානයේදී සමාජයේ ඉහළ ඉල්ලුමක් පවතී. වර්තමානයේදී කුරහන් පිරිසිදු කිරීම අතින් සිදු කෙරේ, වැඩි වේලාවක් ගතවීම හේතුවෙන් නෙලාගත් කුරහන් වලින් අපද්‍රව්‍ය ඉවත් කිරීම අසීරු කාර්යයකි. ශ්‍රී ලංකාව තුළ පිරිසිදු කිරීමේ යන්ත්‍රයක් තැනීමේ උත්සාහයන් කිහිපයක් සිදු කර ඇතත් 100% ගල් ඉවත් කිරීමක් සිදු කර ගැනීමට අපොහොසත් වී ඇත. මෙම කාර්ය සඳහා මැදිරි ආකාරයේ වී සහල් වෙන්කරනයක් භාවිතා කිරිම සඳහා සමහර පිරිසක් උත්සාහ කර ඇත. මෙම යන්ත්‍ර මිල අධික වේ. මෙහිදී ස්කැල්පර් පිරිසිදුකරණයක් සමඟ ඒකාබද්ධ කර කුරහන්වල ගල් ඉවත් කිරීමේ යන්ත්‍රයක් සැලසුම් කිරීම සහ සකස් කිරීමට උත්සාහ කරන ලදී. මෙම යන්ත්‍රයෙන් කුරහන්වල ගල් 99.99% ඉවත් කිරීමට හැකියාව ලැබිණි.

**e) වී පෙඟවීමේදී දහයියා ඉවත් කිරීම යාන්ත්‍රීකරණය කිරීම**

සහල් මෝල්වල වී තැම්බීමේ අංශය සඳහා හඳුන්වාදීම සඳහා දහයියා ඉවත් කිරීමේ යන්ත්‍රය සකස් කරන ලදී. දහයියා ඉවත් කිරීම වී තැම්බීමට පෙර කල යුතු වැඩි ශ්‍රමයක් වැය වන එක් කාර්යයකි. පිරිසිදු කිරීමෙන් පසු වී තැම්බීමට යවනු ලැබේ. දහයියා ජලය මතුපිට පාවෙන අවස්ථාවේදී එම

දහයියා වී පෙඟවීමට පෙර ඉවත් කල යුතු වේ. තවද, පිරිසිදු කිරීමේ ක්‍රියාවලියේදී දහයියා ජලය තුළට ගිලා බැසීම අවම කල යුතු වේ. මධ්‍යම සහ මහා පරිමාණ වී තැම්බීමේදී, දහයියා ඉවත් කිරීමේ ක්‍රියාවලියට වැය වන කාලය පැය පහකට වඩා වැඩි වේ. ජලය තුළදී සේවකයින් නොනවත්වා මහත් වෙහෙස මහන්සියෙන් වැඩ කල යුතු වන අතර ඉතා කෙටි කාලයකින් ඔවුන් වෙහෙසට පත් වන අතර දහයියා ඉවත් කිරීමේ කාර්යක්ෂමතාවය අඩු වේ. එබැවින් දහයියා ඉවත් කිරීම ඉතා ප්‍රමාද වන අතර නිසි පරිදි ඉටු නොවේ. මේ හේතුවෙන් තැම්බූ වී සමඟ අනවශ්‍ය අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් පැවතිය හැකි වේ. මෙම දහයියා ඉවත් කිරීමේ කාර්යක්ෂමතාව තැම්බූ සහල් වල කළු ඇට පැවතීම අඩු කරනු ලැබේ.

එබැවින්, පාවෙන ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා යාන්ත්‍රික ක්‍රමයක් අවශ්‍ය වන අතර එමගින් මෙම අසීරු කාර්යය සඳහා දිගු වේලාවක් ශ්‍රමිකයින් යෙදවීම අඩු කර ගත හැකි වේ. එබැවින් ශ්‍රී ලාංකික සහල් කෙටීමේ කර්මාන්තය සඳහා යාන්ත්‍රීකරණය කරන ලද දහයියා ඉවත් කිරීමේ ක්‍රමවේදයක් සැලසුම් කර ක්‍රියාවට නැංවීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙම සැලසුමේදී පිරිසිදු කිරීමේ හෝ පෙඟවීමේ ටැංකියේ ඉහළ වී ඇතුල් කරන ස්ථානයේ සිට ජලය සමඟ ස්පර්ශ වී කැරකැවෙන පංකාවක් ඇති අනෙක් අන්තය දක්වා දහයියා පා වීම සඳහා මාර්ගයක් හඳුන්වාදෙනු ලැබිණි. මෙම ස්ථානය දක්නා පැමිණෙන දහයියා පෙඟවීමේ ටැංකියෙන් පිටතට යවනු ලැබේ. පංකාව කැරකැවීම සඳහා අශ්ව බල තුනක මෝටරයක් භාවිතා කරන ලදී.

**f) ප්‍රධාන වී නිෂ්පාදන කලාපයන්හි ධාන්‍ය ගබඩාකරණයේ වර්තමාන තත්ත්වය.**

ශ්‍රී ලංකාවේ ධාන්‍ය අතරින් වගාකරනු ලබන ප්‍රධාන කෘෂිකාර්මික ආහාර භෝගය වී වේ. ග්‍රාමීය මට්ටමේ ගොවි ප්‍රජාවෙන් බහුතරයක් ජීවනෝපාය මාර්ගයක් ලෙස වී වගාවේ නිරතව සිටී. වර්තමානයේදී, මෙය බොහොමයක් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල අවධානයට ලක් වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධනයෙහි ජාතික ප්‍රමුඛත්ව අංශයක් වශයෙන් හඳුනාගෙන ඇති දිවයිනෙහි වී අස්වැන්නෙහි සහ වී සහ වෙනත් ධාන්‍ය වගාවෙහි ශීඝ්‍ර වැඩිවීමක් සිදු වී ඇත.
කෙසේවෙතත්, අවිධිමත් පසු අස්වනු ක්‍රියාකාරකම් යොදා ගැනීම හේතුවෙන් ආසන්න වශයෙන් 10% සිට 13% දක්වා ධාන්‍ය ප්‍රමාණයක් පසු නිෂ්පාදන ක්‍රියාකාරකම් තුළදී හානියට පත් වන බව පසුගිය අධ්‍යයන මඟින් අනාවරණය වී ඇත. මෙම හානිය වාර්ෂිකව ආසන්න වශයෙන් වී මෙට්‍රික් ටොන් 420,000කට සමාන වන අතර වාර්ෂික හානියෙහි වටිනාකම ආසන්න වශයෙන් රු.මි. 3780කි. පසු අස්වනු පද්ධතියෙහි ප්‍රධාන ධාන්‍ය හානිය සිදුවන්නේ ගබඩාකිරීමේදී වන අතර විශේෂයෙන් ගොවිපොළ මට්ටමින් ගබඩා කිරීමේදී යොදා ගන්නා අවිධිමත් සහ ප්‍රමාණවත් නොවන ගබඩා පහසුකම් හේතුවෙනි. මෙදී . ගොවිපොළ මට්ටමින් ගබඩා කිරීමේදී ආසන්න වශයෙන් 4 සිට 6% දක්වා ධාන්‍ය හානියක් සිදු වන බව ගබඩාකරණ ධාන්‍ය හානි ඇගයීම පිළිබඳ පසුගිය පර්යේෂණ වලින් අනාවරණ වී ඇත (Fernando,1988). කෙසේවෙතත්, අස්වැන්න වාර අනුව ලැබීම සහ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය වශයෙන් සහල් සඳහා වර්ෂය පුරා සාමාන්‍යයෙන් නොවෙනස් ඉල්ලුමක් පැවතීම හේතුවෙන් වී ගබඩා කර තැබීමේ අවශ්‍යතාවය මතු වේ. දෛනික පරිභෝජනය සඳහා

ඒකකාරී ආහාර සැපයීමක් සහතික කල හැකි වන්නේ සහ පවත්වාගත හැකි වන්නේ විධිමත් ගබඩාකරණයක් තුලින් පමණි. එබැවින් ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා අවාරයේදී භාවිතයට ගැනීම පිණිස අතිරික්ත වී ගබඩා කර තැබිය යුතු වේ. මෙම ගුණාත්මක සහ ප්‍රමාණාත්මක හානි අවම කරමින් ගොවිපොළ මට්ටමින් සහ ගෙවිපොළ නොවන මට්ටමින් ගබඩාකරණ පහසුකම් වැඩිදියුණු කිරීම ගොවීන්ට, සහල් සකස් කරන්නන්ට මෙන්ම පාරිභෝගිකයින්ටද ප්‍රයෝජනවත් වේ.

නමුත් ගොවිපොළ මට්ටමින් සහ ගෙවිපොළ නොවන මට්ටමින් ගබඩාකරණ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා වර්තමාන ගැටළු සහ වෙනත් තත්ත්වයන් අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වර්තමාන තත්ත්වය ඇගයීම සිදු කල යුතු වේ. එබැවින්, ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා සහ ජාතික සංවර්ධන උපායමාර්ග සඳහා ප්‍රධාන නිෂ්පාදන කලාපයන්හි වර්තමාන වී ගබඩා තත්ත්වයන් ඇගයීම අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල සහල් මෝල් හිමියන් සහ වී ගබඩා හිමියන් පිළිබඳ ප්‍රශ්නාවලි 105ක් සම්පූර්ණ කර ඇත.

## g) ශ්‍රී ලාංකික සහල් මෝල්වල විදුලි බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම

වර්තමානයේදී, විදුලිය සහල් මෝල් සඳහා අත්‍යවශ්‍ය නමුත් වඩාත් මිල අධික අවශ්‍යතාවයකි. ඉහළ යන බලශක්ති මිල ගණන් හේතුවෙන් මෙම අංශය වර්තමානයේදී අඩු ලාභයක් සහිතව පවත්වාගෙන යනු ලබන අතර එය මෙම කර්මාන්තයේ තිරසර පැවැත්ම සඳහා බොහෝ බලපෑම් ඇති කරනු ලැබේ. එබැවින්, මෙම ගැටළුව සඳහා විසඳුමක් සොයාගත යුතු වන නමුත් පවතින එකම විසඳුම වන්නේ සහල් මෝල්වල බලශක්ති කාර්ය සාධනය ඉහළ නැංවීම වේ. මෙම ක්‍රියාවලියේ ප්‍රථම පියවර බලශක්ති විගණනයයි.මෙම පද්ධතිවලින් ප්‍රතිඵල නිෂ්පාදනය කිරීමේ ස්ථාවර හෝ අඩුවන මුළු පිරිවැයක් පවත්වා ගනිමින් නිෂ්පාදන ඒකකයක් සඳහා අවශ්‍ය බලශක්තිය අඩු කිරීම සඳහා වන පද්ධති සහ ක්‍රියාපටිපාටි භාවිතා කරමින් බලශක්තිය සීරුමාරු කිරීම සහ ප්‍රශස්තිකරණය කිරීමේ උපායමාර්ගය බලශක්ති විගණනයයි. නිෂ්පාදන ඒකකයක් සඳහා බලශක්ති පරිභෝජනය හෝ හානිය අවම මෙහෙයුම් පිරිවැය කරා අඩු කිරීමේ ක්‍රමවේද නිශ්චය කිරීම සඳහා බලශක්ති විගණන පැවැත්වීම අවශ්‍ය වේ. ආයතනය හෝ පද්ධතිය තුළ බලශක්තිය කළමනාකරණය කිරීම සඳහා "මිනුම් ලකුණු" පිහිටුවීමටද බලශක්ති විගණන අවශ්‍ය වේ. මූලික බලශකිත් පරිභෝජන විස්තර සොයාගැනීම සඳහා මහා පරිමාණ තැම්බූ සහල් මෝල්වල බලශක්ති විගණන පවත්වන ලදී. .

තැම්බූ සහල් කි.ග්‍රෑ. 1ක් සඳහා විශේෂිත විදුලිබල පරිභෝජනය (SEEC) කි.වො.පැ. 0.10 සිට 0.40 දක්වා පරාසයක වෙනස් විය. තැම්බූ සහල් කි.ග්‍රෑ. 1ක් සඳහා සහල් මෝලක සාමාන්‍ය විශේෂිත විදුලිබල පරිභෝජනය (SEEC) කි.වො.පැ. 0.15කි. තැම්බූ සහල් කි.ග්‍රෑ. 1ක් සඳහා විශේෂිත තාප පරිභෝජනය (STEC) කි.ජූල් 4472කි. තැම්බූ සහල් කි.ග්‍රෑ. 1000ක් සඳහා වී පොතු පරිභෝජනයෙහි මධ්‍යයනය කි.ගෑ.350 කි. එබැවින්, තැම්බූ සහල් කි.ග්‍රෑ. 1ක් සඳහා විශේෂිත වී පොතු පරිභෝජනය (SPHC) කි.ග්‍රෑ.0.35කි.

අනවශ්‍ය විදුලි පරිභෝජනය සඳහා හේතු සමහරක් වන්නේ; ඉහළ ධාරිතාවයක් සහිත මෝටර ක්ෂණිකව පණගැන්වීම සහ ක්‍රියාවිරහිත කිරීමේදී ක්ෂණිකව ලබාගන්නා ඉහළ ධාරාව; පැනලයෙහි උප මානන පහසුකම් නොමැති වීම; සාම්ප්‍රදායික ස්ටාටර ස්විච භාවිතා කිරීම; නඩත්තු වාර්තා නොමැති වීම; ජව සාධකය අඩු වීම ආදියයි. වැඩිදියුණු කලයුතු අංශ වන්නේ; උපරිම ඉල්ලුම වෙනස්වීම සම්බන්ධයෙන් සේවකයින්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම; ප්‍රධාන අංශ සඳහා විදුලි මනු සමඟ වෙන් වූ පරිපථ බිඳින හඳුන්වාදීම සහ උප පරිපථ බිඳිනවලට සම්බන්ධ කිරීම සහ දෛනික ආංශික බලශක්ති පරිභෝජනය වාර්තාගත කිරීම; බර යන්ත්‍රසූත්‍ර සඳහා මෘදු ස්ටාටර් භාවිතා කිරීම; නිෂ්පාදකයාගේ නඩත්තු නිර්දේශ අනුව කටයුතු කිරීම සහ එක් එක් නඩත්තුව සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීම; ඉහළ ධාරිතාවයක් සහිත මෝටර සඳහා ධාරිත්‍රක එකතුවක් භාවිතා කිරීම; ආදියයි.

**2.1.1.2 පලතුරු සහ එළවළුවල පසු අස්වනු තාක්ෂණය**

**a) එළවළු සහ පලතුරු සඳහා විජලන සහ අධිශීත කිරීමේ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.**

විජලනය:

පලතුරු සහ එළවළු විජලනය කිරීම සඳහා සූර්ය තාපයෙන් වියළීම, සූර්ය බලශක්තියෙන් වියළීම, රික්තක වියළීම සහ වියළීමට පසුව යාන්ත්‍රික වියළනයක සෙන්ටිග්‍රේඩ් අංශක 55ක උෂ්ණතවයක් යටතේ වියළා ඉන් අනතුරුව පරීක්ෂණාගාර පරිමාණයේ වායු උදුනකින් වියළීම වැනි විවිධ විජලන ක්‍රමවේදයන්ගේ ප්‍රතිඵලය ඇගයීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. බෙලි (*Aegle marmelos*), තල් (*Borassus flabellifer*), කටු අනෝදා (*Annona muricata*), බතල (*Ipomoea batata*), වට්ටක්කා (*Cucurbita maxima*), සහ වද (Hibiscus *rosasinensis*) විජලනය කර සකස් කර ගත් පලතුරු කුඩු වල ආසන්න සංයුතිය, රසායනික සහ ප්‍රතිඔක්සිකාරක ගුණ, ක්ෂුද්‍රජීව තත්ත්වය ඇගයීමට ලක් කෙරිණි. පිලිස්සීමට සූදානම් ක්ෂණික නිර්මාංශ කේක් මිශ්‍රණය, ක්ෂණික ඖෂධීය පානය සහ ක්ෂණික ජෙලි මිශ්‍රණය වැනි විවිධ නිෂ්පාදන පිළියෙල කරන ලදී. එම නිෂ්පාදනවල භෞතික, රසායනික, ක්ෂුද්‍රජීව සහ සංවේදක ගති ලක්ෂණ ඇගයීමට ලක් කෙරිණි. ලැබනු ප්‍රතිඵල අනුව පළතුරු කුඩුවල රසායනික ගති ලක්ෂණ ආරක්ෂා කරගනිමින් සහ ප්‍රතිඔක්සිකාරක ගුණ රඳවාගනිමින් සිදු කල හැකි ඵලදායී වියළන ක්‍රමවේදය ලෙස රික්තක වියළීම නිර්දේශ කල හැකි වේ. ක්ෂණික ඖෂධීය පානය සඳහා භාවිතා කල විවිධ ප්‍රතිකාර තුන අතරින්; බෙලි කුඩු ග්‍රෑම් 60+සීනි ග්‍රෑම්40+ඉඟුරු ග්‍රෑම්2 මිශ්‍රණය එහි ආසන්න සංයුතිය සහ සංවේදක ගුණ ආරක්ෂා කර ගැනීමට සමත් විය. ක්ෂණික. පිලිස්සීමට සූදානම් ක්ෂණික නිර්මාංශ කේක් මිශ්‍රණය සඳහා භාවිතා කරන ලද විවිධ සංයුතීන් අතරින් තිරිඟු පිටි, සහල් පිටි, බෙලි කුඩු සහ වට්ටක්කා කුඩු පිළිවෙළින් 10%,17%,3% සහ 15% වශයෙන් අඩංගු වූ ප්‍රතිකාරකය අනෙකුත් සුළු රස ද්‍රව්‍ය සමඟින් වඩාත් සුදුසු සංයෝජනය වූ අතර කිසිදු ගුණාත්මක හානියකින් තොරව දින 90ක කාලයක් ගබඩා කර තබා ගත හැකි විය. පෙක්ටින් සහ ජෙලටින් ජෙලටිනීකාරක ලෙස භාවිතා කරමින් සකස් කල ජෙලි නිෂ්පාදනය; ජෙලටින් 2.36%ක් සමන්විත වන මිශ්‍රණයෙන් සකස් කරන ලද ජෙලි,

ඇගයීමට ලක් කරන ලද සියළු සංවේදක ගති ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් වඩාත් සතුටුදායක නිෂ්පාදනය විය.

අධිශීත කිරීම:

තිබ්බටු සහ කොස් මදුළු වැනි එළවළුවල පසු අස්වනු ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා ධාරා අධිශීත කිරීමේ බලපෑම ඇගයීම සඳහා මූලික අත්හදා බැලීම් කිහිපයක් සිදු කරන ලදී. විරංජන අවස්ථා උෂ්ණත්වය, අධිශීතකරණ උෂ්ණත්වය, අධිශීත ගබඩාකරණ තත්ත්වයන් ඇගයීමට ලක් කෙරිණි.

**b) විජලනය කල මුරුංගා පත්‍ර යොදාගනිමින් පෝෂණ මිශ්‍රණයක් සකස් කිරීම**

පෝෂණ මිශ්‍රණ, දෛනිකව ලබාගත යුතු බවට නිර්දේශිත විටමින් සහ ඛනිජලවණ වලින් සමන්විත වඩා හොඳ අතිරේකයක් විය හැකි ක්ෂණික ආහාර වර්ගයකි. මුරුංගා පත්‍ර සහ වට්ටක්කා ශ්‍රී ලංකාවේ සියළුම පළාත්වලින් පාහේ සුලබව ලබාගත හැකි අතර ඒවා පෝෂණ මිශ්‍රණවල සාම්ප්‍රදායිකව අඩංගු වන ද්‍රව්‍යවල පෝෂණ තත්ත්වයන් වෙනස් නොකරමින් ඒ වෙනුවට ආදේශක ලෙස යොදා ගැනීම සඳහා සුදුසු වේ. මෙම භෝග ශ්‍රී ලංකාවේ ඌන උපයෝජිත භෝග වන බැවින් ඒවා උපරිම අයුරින් භාවිතයට ගැනීමට නව මාර්ගයක් හඳුන්වාදීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

ප්‍රතිකාරක ලෙස, විජලනය කරන ලද මුරුංගා පත්‍ර (t1 =2%, t2 = 3% ,t3= 4% , t4= 5% ) සහ විජලනය කරන ලද වට්ටක්කා කුඩු (t1 =18% , t2 = 17% ,t3= 16% , t4= 15% ) විවිධ ප්‍රමාණයන්ගෙන් යොදා ගනිමින් වට්ටෝරු හතරක් සකස් කරන ලදී. පසුව පෝෂණ මිශ්‍රණය සෑදීම සඳහා රතු සහල් (60%) සහ මුංඇට (20%) නොවෙනස් ප්‍රමාණයන්ගෙන් එකතු කරනු ලැබීය. නවයිව් පොයින්ට් හෙඩොනික් ස්කේල් භාවිතා කරමින් නුපුහුණු මණ්ඩල සාමාජිකයින් 30 දෙනෙකු යොදා ගනිමින් නියැදි හතරෙහි සංවේදක ඇගයීම සිදු කරන ලදී. ප්‍රතිකාරක සැලකිය යුතු අයුරින් වෙනස් වන බව ප්‍රතිඵල වලින් නිරීක්ෂණය විය ($p< 0.05$). සියළු සංවේදක ගති ලක්ෂණ සඳහා ප්‍රතිකාරක අංක 2 (මුරුංගා කුඩු 3% සහ වට්ටක්කා කුඩු 17%) ඉහළ මධ්‍යස්ථ ලකුණු ලබා ගත් අතර ප්‍රතිකාරක අංක 4 (මුරුංගා කුඩු 5% සහ වට්ටක්කා කුඩු 15%) අවම මධ්‍යස්ථ ලකුණු සංඛ්‍යාවක් පෙන්නුම් කළේය. එබැවින් අනෙක් මිශ්‍රණ අතරින් සැළකිය යුතු ඉහළ සංවේදක ගති ලක්ෂණ පෙන්නුම් කරන ලද ප්‍රතිකාරක අංක 2 වඩාත් හොඳ ද්‍රව්‍ය සංයෝජනය ලෙස තෝරා ගන්නා ලදී.

**c) මුරුංගා (Moringa oleifera) පත්‍ර පදනම් කරගත් පාන් තැවරුමක් සකස් කිරීම**

මුරුංගා පත්‍රවල ප්‍රෝටීන්, කැල්සියම්, මැග්නීසියම්, යකඩ, විටමින් A, චෝලින්, තියමින්, විටමින් C සහ වැලින් ඉහළ ප්‍රමාණවලින් අන්තර්ගත වේ. ශ්‍රී ලංකාවේ ඌන උපයෝජිත ශාකයක් ලෙස සැලකෙන මුරුංගා ශාකයෙහි විජලනය කරන ලද පත්‍ර කුඩු යොදා ගනිමින් පාන් තැවරුමක් සකස් කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. විජලනය කරන ලද මුරුංගා පත්‍ර කුඩු (t1=35%,t2=40% ,t3=45%, t4= 50%) සහ විජලනය කරන ලද කැරට් කුඩු (t1=15%,t2=10% ,t3=5%, t4= 0%)

විවිධ ප්‍රමාණයන්ගෙන් යොදා ගනිමින් ප්‍රතිකාරක ලෙස වට්ටෝරු හතරක් සකස් කරන ලදී. ෆයිව් පොයින්ට් හෙඩොනික් ස්කේල් භාවිතා කරමින් නුපුහුණු මණ්ඩල සාමාජිකයින් 30 දෙනෙකු යොදා ගනිමින් නියැදි හතරෙහි සංවේදක ඇගයීම සිදු කෙරිණි. ක්‍රමාරෝපිත පරීක්ෂණයන්හි සම්පූර්ණ සසම්භාවිත සැලසුමක් භාවිතා කරමින් ප්‍රතිඵල විශ්ලේෂණය කරන ලදී. සියළු ප්‍රතිකාරක අතරින් වඩාත් හොඳ වට්ටෝරුව වූයේ මුරුංගා පත්‍ර 45%, කැරට් කුඩු 5%, මාගරීන් 35%, ලූණු 8.4%, විනාකිරි 3%, මස්ටඩ් 1.2%, ගම්මිරිස් 1.2% සහ ලුණු 1.2% අඩංගු වට්ටෝරුවයි. සංවේදක ඇගයීමෙන් තෝරාගත් වට්ටෝරුව ඇසුරුම් ද්‍රව්‍ය (වීදුරු බොතල්, පොලිප්‍රොපලීන් භාජන) දෙකක ගබඩා කර ගබඩාකරණ තත්ත්ව දෙකක, වායුගෝල තත්ත්ව (සෙන්ටිග්‍රේඩ් අංශක 28-30, සාපේක්ෂ ආර්ද්‍රතාව 65%-75%) සහ ශීතකරණයක (සෙන්ටිග්‍රේඩ් අංශක 7-9, සාපේක්ෂ ආර්ද්‍රතාව 75%-80%) මාස තුනක කාලයක් තබන ලදී. සම්මත ක්‍රමවේද භාවිතා කරමින් නිෂ්පාදනවල තෙතමන ප්‍රමාණය, ආම්ලිකතාවය, pH අගය, මුඩු බව, ක්ෂුද්‍රජීවී ප්‍රමාණය සහ සංවේදක යෝග්‍යතාවය මාසිකව නිශ්චය කරන ලදී. මාසයකට පසු පොලිප්‍රොපලීන් භාජනවල වායුගෝල තත්ත්ව යටතේ ගබඩා කරන ලද නියැදියෙහි ආම්ලිකතාව අඩුවීම, pH අගය සහ තෙතමන තත්ත්වය ඉහළ යෑම නිරීක්ෂණය කරන ලද අතර ක්ෂුද්‍රජීවී ප්‍රමාණය මාගරීන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නියම කර ඇති ප්‍රමාණය ඉක්මවා තිබිණි. එසේම පොලිප්‍රොපලීන් භාජනවල ශීතකරණයක ගබඩා කර තැබූ නියැදිවලද මාස දෙකකට පසු සමාන ප්‍රතිඵල නිරීක්ෂණය විය. ශීතකරණ තත්ත්ව සහ වායුගෝල තත්ත්ව යටතේ වීදුරු බෝතල්වල මාස තුනක කාලයක් ගබඩා කර තැබූ නියැදිවල තෙතමන තත්ත්වයෙහි සහ pH අගයෙහි සැලකිය යුතු වෙනසක් ($P= 0.05$ ) නිරීක්ෂණය වූ අතර ශීතකරණ සහ වායුගෝල තත්ත්ව යටතේ වීදුරු බෝතල් තුල ගබඩා කර තැබූ නියැදිවල පළමු මාසයේදී අනුමාපන ආම්ලිකතාවයෙහි සැළකිය යුතු වෙනසක් නිරීක්ෂණය නොවිණි. කෙසේවෙතත්, මාස තුනක් දක්වා වූ ගබඩාකරණ කාලපරිච්ඡේදයේදී සියළු තත්ත්ව යටතේ කෝලිෆෝම් බැක්ටීරියා ඝනත්වය ශූන්‍යය විය. විජලනය කරන ලද මුරුංගා පත්‍ර කුඩු යොදා ගනිමින් හොඳ තත්ත්වයේ පාන් තැවරුමක් සකස් කරගත හැකි බවත් ශීතකරණ සහ වායුගෝල තත්ත්ව යටතේ වීදුරු බෝතල් තුළ අසුරා ගුණාත්මක හානියකින් තොරව මාස තුනක කාලයක් ගබඩා කර තබා ගත හැකි බවත් අධ්‍යයනයෙන් අනාවරණය විය.

**d) ශ්‍රී ලංකාවේ ප්‍රධාන සැපයුම්දාමයන්හි එළවළු ප්‍රවාහනය සඳහා ආරක්ෂාකාරී ඇසුරුමක් යොදා ගැනීම**

ඉතා විශාල ප්‍රමාණයන්ගෙන් අස්වැන්න පරිහරණය කරනු ලබන ප්‍රධාන එළවළු වර්ග වන ගෝවා, කැරට්, බීට්රූට් සහ වැටකොළු සඳහා ආරක්ෂාකාරී ඇසුරුමක් යොදා ගැනීමේ තාක්ෂණික ශක්‍යතාව නිශ්චය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. ඒවා, එළවළු ආරක්ෂාකාරී ඇසුරුම්වල ප්‍රවාහනය කළ යුතු වන බවට පනවා ඇති නියාමනයෙන් නිදහස් කර ඇත. දඹුල්ල සිට කොළඹ, තඹුත්තේගම සිට කොළඹ, නුවරඑළිය සිට කොළඹ සහ යාපනයේ සිට දඹුල්ල යන සැපයුම් දාම හරහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ඇසුරුම් වර්ග ලෙස ප්ලාස්ටික් කූඩ සහ පොලිසැක් කවර යොදා ගන්නා

ලදී. ආරම්භක ස්ථානයේ තොග වෙළඳපොළෙන් ගොවීන් විසින් ප්‍රවාහනය කරනු ලබන එළවළු අහඹු ආකාරයෙන් තෝරා ගෙන, ඒවා පොලිසැක් කවරවල සහ ප්ලාස්ටික් කුඩවල අසුරා ගමනාන්ත කරා ප්‍රවාහනය කරන ලදී. නිෂ්පාදනයෙහි ස්කන්ධ හානිය, වර්ණ වෙනස්වීම, දෘෂ්‍ය ගුණාත්මකභාවය, දැඩි බව, TSS සහ රෝගාබාධ ප්‍රවාහනය අවසානයේදී ඇගයීමට ලක් කරන ලදී. දින දෙකකට පසු සිල්ලර වෙළෙන්දාගේ සහ පාරිභෝගිකයාගේ අදියරයන්හිදී සිදු වී ඇති හානිය නිශ්චය කිරීම සඳහා ඇසුරුම් වර්ග දෙකෙහිම ප්‍රවාහනය කරන ලද එළවළුවල මෙම පරාමිති නැවත ඇගයීමට ලක් කෙරිණි.

ආරම්භක වෙළඳපොළවලදී කිසියම් ප්‍රමාණයක හානියක් නිරීක්ෂණය විය. එළවළුවල පසු අස්වනු හානියෙහි ප්‍රධාන හේතු කාරකය වන්නේ, යාන්ත්‍රික හානිය බව ප්‍රතිඵලවලින් නිරීක්ෂණය විය. පොලිසැක් කවර සහ ප්ලාස්ටික් කුඩවල ප්‍රවාහනය කරන ලද බීට්රූට්වල පසු අස්වනු හානියෙහි සැලකිය යුතු වෙනසක් නොපෙන්වන බව අධ්‍යයනයෙන් අනාවරණය විය. නමුත් ගෝවා, කැරට් සහ වැටකොළුවල ප්‍රවාහන හානිය ප්ලාස්ටික් කුඩ යොදා ගැනීමෙන් අඩු කළ හැක. ප්ලාස්ටික් කුඩවල ප්‍රවාහනය කිරීමේදී එළවළුවල සමස්ත දෘෂ්‍ය ගුණාත්මකභාවය ද වඩාත් හොඳ විය. ඇසුරුම් වර්ග දෙකෙන්ම ප්‍රවාහනය කරන ලද මැකරල් සහ බණ්ඩක්කාවල සිල්ලර වෙළඳ සැල, පාරිභෝගික මට්ටමින් වෛරස් ආසාදන නිරීක්ෂණය විය. ප්ලාස්ටික් කුඩ හා සැසඳීමේදී පොලිසැක් කවරවල ප්‍රවාහනය කරන ලද එළවළුවල නිෂ්පාදන දැඩිභාවයට හානි සිදුවීම සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතී. ප්ලාස්ටික් කුඩ භාවිත කිරීමෙන් ගෝවා, කැරට් සහ වැටකොළුවල ප්‍රවාහන හානිය පිළිවෙළින් 5.8%, 15.8% සහ 14.7%කින් අඩු කළ හැකි වන බවත් පසු නිෂ්පාදන පරිහරණයේදී එළවළුවල ගුණාත්මක පරාමිති ආරක්ෂා වන බවත් නිරීක්ෂණය විය.

**e) දැව්මය ඇසුරුම් භාවිත කිරීමෙන් ලීක්ස් (Allium porum) ප්‍රවාහනය කිරීමේදී සිදු වන පසු අස්වනු හානිය අඩු කිරීම**

ලීක්ස් (Allium porum) ශ්‍රී ලංකාවේ වැවෙන එළවළු වර්ගවලින් ප්‍රමුඛස්ථානයක් ගන්නා ආර්ථිකමය වටිනාකමක් සහිත එළවළුවකි. දිගින් වෙනස් වීම හේතුවෙන් වර්තමානයේදී භාවිත වන ඇසුරුම් ලීක්ස් ප්‍රවාහනය සඳහා සුදුසු නොවන අතර වාර්තාගත වාර්ෂික හානිය 15.7%කි. නුවරඑළියේ සිට දඹුල්ල දක්වා සැපයුම් දාමයෙහි ලීක්ස් ප්‍රවාහනය කිරීම සඳහා දැව්මය ඇසුරුම්වල යෝග්‍යතාවය මෙම අධ්‍යයනයෙන් ඇගයීමට ලක් කරන ලදී. යොදා ගත් ප්‍රතිකාරක; T1-සෙ.මී.75 x සෙ.මී.45 x සෙ.මී.25 ඇසුරුම් උස සෙ.මී.20, T2- සෙ.මී.75 x සෙ.මී.45 x සෙ.මී.30 ඇසුරුම් උස සෙ.මී.25, T3- සෙ.මී.75 x සෙ.මී.45 x සෙ.මී.25 ඇසුරුම් උස සෙ.මී.20, T4- සෙ.මී.75 x සෙ.මී.45 x සෙ.මී.30 ඇසුරුම් උස සෙ.මී.25 සහ T5-සෙ.මී.80 x සෙ.මී.45 x සෙ.මී.30 ප්ලාස්ටික් ආවරණයක් සහිත කම්බියකින් පැති හතරම ආවරණය කල ඇසුරුම් උස සෙ.මී.25. පවතින ප්‍රවාහන ඇසුරුම වන පොලිසැක්වලින් දවටා මැදින් ලණුවකින් ගැට ගසන ලද ඇසුරුම (T6) පාලකය ලෙස යොදා ගන්නා ලදී. ප්‍රවාහනය අතරතුරදී පැකේජය තුළ උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාවය, ශ්වසන ශීඝ්‍රතාවය සහ එතිලීන් නිෂ්පාදනය පැය හතරකට වරක් මනින ලදී. නිෂ්පාදනයෙහි තත්ත්වය ඇගයීම සඳහා; ස්කන්ධ හානිය, දෘෂ්‍ය ගුණාත්මකභාවය (VQR), භෞතික හානිය, මැලවීමේ ශීඝ්‍රතාවය ප්‍රවාහනය

කිරීමට පෙර සහ ප්‍රවාහනයෙන් පසුව මනින ලදී. පරීක්ෂා කරන ලද ඇසුරුම් ක්‍රමවේද අතරින් T2- සෙ.මී.75 x සෙ.මී.45 x සෙ.මී.30 ඇසුරුම් උස සෙ.මී.25, ඉහළ දෘෂ්‍ය ගුණාත්මක අනුපාතයක් පවත්වා ගනිමින් සහ මැලවීමේ ප්‍රතිශතය, භෞතික හානිය සහ ස්කන්ධ හානිය (%) අඩු කරමින් වඩාත් හොඳ කාර්ය සාධනයක් පෙන්නුම් කළේය.

**f) ශ්‍රී ලංකාවේ සැපයුම්දාම ක්‍රියාකාරකම් තුළදී කෙසෙල්වල පසු අස්වනු හානිය සහ ගුණාත්මකභාවය පිරිහීම ඇගයීම**

ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම වගා කරන සහ පරිභෝජනය කරන පළතුරු භෝගය කෙසෙල් වේ. එහි කල් තබා ගැනීමට නොහැකිවීමේ ගති ලක්ෂණය සහ අවිධිමත් පසු අස්වනු භාවිත ක්‍රියාකාරකම් හේතුවෙන් සැපයුම්දාම ක්‍රියාකාරකම් අතරතුර කෙසෙල්වල පසු අස්වනු හානිය ඉතා ඉහළ වේ. එබැවින්, විවිධ පරිහරණ අදියරයන්හිදී කෙසෙල්වල පසු අස්වනු හානිය ඇගයීම සඳහා සහ මෙම හානිවලට හේතු වන සාධක හඳුනා ගැනීම සඳහා පර්යේෂණයක් සිදු කරන ලදී. පසු අස්වනු හානි අඩු කර ගැනීම සඳහා මෙන්ම පළතුරෙහි ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම සඳහා මෙය පසු අස්වනු කර්මාන්තයට ඉතා විශාල වශයෙන් ප්‍රතිලාභ අත්කර දෙනු ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෙසෙල් ප්‍රවාහන දාමය වන ඇඹිලිපිටියේ සිට කොළඹ දක්වා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ගොවියා, ප්‍රවාහනය කරන්නා/ තොග වෙළෙන්දා, සිල්ලර වෙළෙන්දා සහ පාරිභෝගිකයා යන මට්ටම්වලදී සිදු වන ප්‍රමාණාත්මක හානිය සහ ගුණාත්මකභාවයෙහි පිරිහීම අධ්‍යයනය කරන ලදී. කෙසෙල්වල මුළු යාන්ත්‍රික හානිය 21.82%කි. පසු නිෂ්පාදන අවධියේදී භෞතික ස්කන්ධ හානිය 9.34%කි. ගොවියාගේ සිට පාරිභෝගිකයා දක්වා සමස්ත දෘෂ්‍ය ගුණාත්මකභාවය විශිෂ්ට අවස්ථාවේ සිට දුර්වල අවස්ථාව දක්වා වෙනස් වූ අතර එය පාවිච්චියට ගැනීමේ හැකියාව සීමා කිරීමට හේතු විය. සැපයුම්දාමයේදී පළතුරුවල දෘඪභාවය 61.88 N කින් අඩු විය. අවිධිමත් ඇසුරුම් ක්‍රමවේද භාවිත කිරීම කෙසෙල්වල පසු අස්වනු හානියෙහි ප්‍රධාන හේතු කාරකය වන බව හඳුනා ගන්නා ලදී.

**g) අඹ, ගස්ලබු සහ අන්නාසි සඳහා IPHT පල්ප නිස්සාරකය ඇගයීම**

පළතුරු යුෂ සහ පළතුරු පල්ප පරිභෝජනයට ගැනීමෙන් ප්‍රතිලාභ රාශියක් ලැබේ. කල් තබා ගන්නා ලද පල්පවලින් එක් එක් පළතුරු ප්‍රභේදයේ අඛණ්ඩ පැවැත්ම සහතික කරනු ලැබේ. පළතුරු ඉදවීමේ ගැටලුවක් පාරිභෝගිකයන්ට ඇති නොවන අතර එවෙලෙහිම පරිභෝජනය නොකරන නැවුම් පළතුරුවල හානියද මෙමගින් වැළකේ. එබැවින්, පල්ප නිස්සාරණය වර්තමානයේදී වැදගත් ක්‍රියාවලියක් වී ඇත. පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් පල්ප නිස්සාරකයක් හඳුන්වා දී ඇති අතර එය සියඹලා පල්ප නිස්සාරණය කිරීම සඳහා විශේෂයෙන් සැලසුම් කරන ලද්දකි. එම යන්ත්‍රයම ගස්ලබු සහ අන්නාසිවලින් පල්ප නිස්සාරණය කර ගැනීම සඳහා ඇගයීමට ලක් කරන ලදුව සාර්ථක විය. ගස්ලබු සහ අන්නාසි සඳහා නිස්සාරණ කාර්යක්ෂමතාවය පිළිවෙළින් 84.2%ක් සහ 82.2%ක් වන බවත් ගස්ලබු සහ අන්නාසි සඳහා පල්ප නිස්සාරණය පිළිවෙළින්

60.5%ක් සහ 48.7%ක් වන බව සොයා ගැණිනි. අන්නාසි සහ ගස්ලබු සඳහා යන්ත්‍රයෙහි ඇතුළත් කිරීමේ ධාරිතාවන් පිළිවෙළින් පැයට කිලෝග්‍රෑම් 527ක් සහ පැයට කිලෝග්‍රෑම් 540ක් විය.



ගස්ලබුවලින් පල්ප නිස්සාරණය



අන්නාසිවලින් පල්ප නිස්සාරණය

**h) ශ්‍රී ලංකාවේ අඹ ආශ්‍රිත පසු අස්වනු ගැටළු හඳුනා ගැනීම සඳහා සිදු කරන ලද සමීක්ෂණය**

අඹ, ශ්‍රී ලංකාවේ පළතුරුවලින් ප්‍රමුඛස්ථානය ගන්නා පළතුරකි. එය දිවයින පුරා බහුලව ව්‍යාප්තව ඇත. අවුරුදු දහසකට පෙර සිට එය ශ්‍රී ලාංකිකයන් සඳහා ඉතා රසවත් සහ ආර්ථික වටිනාකමක් සහිත පළතුරක් ලෙස සලකන ලදී. වර්තමානයේදී එය වාණිජ සහ ගෘහස්ථ මට්ටමින් වගා කරනු ලැබේ. අඹ වාරය අනුව හට ගන්නා, කල් තබා ගත නොහැකි, සර්ම කලාපීය, සෘතුමය පළතුරකි. පළතුරු නෙළීමෙන්, විකිණීමෙන්, සකස් කිරීමෙන් සහ අපනයනය කිරීමෙන් බොහෝ පුද්ගලයන් ආදායම් උපයයි. අඹවල බොහෝ වටිනාකම් පැවතුණද, එය බොහොමයක් පසු අස්වනු ගැටළුවලින් යුක්ත වේ. උදාහරණ ලෙස දිලීර සහ බැක්ටීරියා රෝග, නටු අග කුණුවීම, අස්වනු නෙළීමේ ගැටළු, යාන්ත්‍රික හානි, අයෝග්‍ය ඉදවීමේ ක්‍රමවේදය සහ ප්‍රවාහන හානි ගත හැක. මෙම ගැටළු හේතුවෙන් අඹවල ගුණාත්මකභාවය සහ වෙළඳපොළ වටිනාකම අඩු වේ. මේ දිනවල, ඉහත ගැටළු නිසා විශාල මුදලක් අප විසින් අහිමි වී ඇත. එබැවින්, පසු අස්වනු ගැටලු හඳුනා ගැනීමට සහ සුදුසු විසඳුම් ලබා දීම සඳහා මෙම සමීක්ෂණය නිසැකවම වැදගත් වේ. තොරතුරු හා සම්බන්ධිත ප්‍රශ්නාවලි 75ක් සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ කර ඇත.

**2.1.1.3. වෙනත් භෝගවල පසු අස්වනු තාක්ෂණය**

**a) මී තෙල් සඳහා කාර්යක්ෂම නිස්සාරණ ක්‍රියාවලියක් ඇගයීම**

සැපොටේසියේ කුලයට අයත් *Madhuca longifolia* හෙවත් *M. indica*, ඉන්දියාව පුරා වැවෙන ආර්ථික වටිනාකමක් සහිත ශාඛයක් වන අතර එය ශ්‍රී ලංකාවේද වැවෙයි. නමුත් පරිභෝජනය සිදු කරනු ලබන්නේ කුරුණෑගල, කෑගල්ල, මහනුවර ආදි වූ ශාඛය වැවෙන ප්‍රදේශවල පමණි. මී පරිභෝජනය කිරීම සඳහා පුරුදු වී සිටින ජනතාව වුවද මී ඇටවලින් මී තෙල් නිස්සාරණය

කිරීම සඳහා මේ වන විටත් භාවිත කරනු ලබන්නේ "පහ" නමින් හඳුන්වන පාරම්පරික ක්‍රමවේදයයි. බර අනුව බීජයකින් 70%ක් මදවලින් යුක්ත වේ, බීජයක් සෙ.මී.2.5 x සෙ.මී1.75ක ප්‍රමාණයේ මද දෙකකින් යුක්ත වේ.ලැටිෆෝලියාවල තෙල් ප්‍රමාණය 46% ක් වන අතර ලොන්ජිෆෝලියාවල 52%කි. බීජවල තෙල් ප්‍රමාණය වන අතර ප්‍රෝටීන ප්‍රමාණය 16%කි.

මී තෙල් නිස්සාරණය කර ගැනීම සඳහා කුඩා පරිමාණයේ ඉස්කුරුප්පු ආකාරයේ තෙල් නිස්සාරකයක් අත්හදා බැලීම මෙම පර්යේෂණ අධ්‍යයනයෙන් අරමුණු කෙරිණි. ඉස්කුරුප්පු තෙරපුම් යන්ත්‍රය මූලික වශයෙන් බෙයාරිමක සහාය ලබා කේතු ආකාර දණ්ඩක් මත සවිකර ඇති සර්පිලාකාර ඉස්කුරුප්පුවක් වන අතර එය ස්ථාවර සිලින්ඩරාකාර බැරලයක් තුල කරකැවෙමින් පවතී. දණ්ඩ කරකැවෙන විට, යන්ත්‍රයෙහි තෙල් නිකුත්වන අන්තය දෙසට ඇති ඉස්කුරුප්පුව හොපරය හරහා ඇතුල් කරන ලද තෙල් බීජ ඒවා තෙරපුමට ලක් කරනු ලබන ස්ථානය කරා යොමු කරනු ලැබේ. ඇඹරීමට ලක් කල යුතු මී බීජ හොපරය තුළ තබන අතර කි.වො. 4 ක මෝටරය එකිනෙකට වෙනස් වේග තුනකින් ඉස්කුරුප්පු දණ්ඩ නොනවත්නා කරකවනු ලැබේ. මෙම පරීක්ෂණය සඳහා මි.මී.25 ක සීරුමාරුවක් සහිත ඉස්කුරුප්පු දණ්ඩක් සහ මි.මී. 75x315 අභ්‍යන්තර බැරලයක් සහිත චීනයේ නිෂ්පාදිත ජනප්‍රිය ඉස්කුරුප්පු ආකාරයේ තෙල් නිස්සාරක යන්ත්‍රයක් භාවිතා කෙරිණි. මෙම යන්ත්‍රය මූලික වශයෙන් තෙරපුම් කොටසකින්, සීරුමාරු කිරීමේ කොටසකින් සහ සම්ප්‍රේෂණය කිරීමේ කොටසකින් යුක්ත වේ. පොල් තෙල් නිස්සාරණය සඳහා බහුලව යොදාගන්නා මෙම යන්ත්‍රය පාරම්පරික මට්ටමින් මී තෙල් නිස්සාරණය කර ගැනීම සඳහා වෙනස් කරන ලද අතර මෙය මින් ඉහතදී තල තෙල් නිස්සාරණය සඳහා අත්හදා බලා ඇත.

**b) නිදන්ගත වකුගඩු රෝගයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ආහාර සහ ආහාර පුරුදු සමීක්ෂණය කිරීම**

හේතුකාරකය නොදන්නා නිදන්ගත වකුගඩු රෝගය **(CKDue)** ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමින් පවතින එක් ප්‍රධාන සෞඛ්‍යමය ගැටලුවකි. කෙසේ වෙතත්, මෙම රෝගය ඇතිවීමට හේතුව මේ වන තෙක් සොයා ගෙන නොමැති අතර බොහොමයක් පුද්ගලයින් දිනපතා මෙම රෝගයට ලක්වීමද, එයින් මිය යාමද සිදු වේ. උතුරුමැද කලාපයේ වෙන් වූ සීමිත ප්‍රදේශයක මෙම නිදන්ගත වකුගඩු රෝගය පැතිර පවතී. බලපෑමට ලක් වූ ප්‍රදේශ වන්නේ, මැදවච්චිය, ගිරාඳුරුකෝට්ටේ, පදවිය, මැදිරිගිරිය, දෙහිඅත්තකණ්ඩිය සහ නිකවැව කලාපයන් වේ. ශරීරයට බැර ලෝහ ඇතුළු වීම, ජලයෙහි ෆ්ලෝරයිඩ් මට්ටම ඉහළ අගයක පැවතීම, දියවැඩියාව, ආතතිය සහ තවත් දේ මේ සඳහා හේතු විය හැකි වන බවට හඳුනාගෙන ඇතත් සත්‍ය හේතුව තහවුරු කළ හැකි විද්‍යාත්මක සාක්ෂි මේ වන තෙක් සොයා ගෙන නොමැත.

ශ්‍රී ලංකාවේ බොහොමයක් රෝග සහ සෞඛ්‍ය ගැටලු සඳහා ප්‍රධාන හේතුව වන්නේ ජනතාවගේ ආහාර රටා සහ ආහාර පුරුදු වේ. එබැවින්, ආහාර සහ ආහාර පුරුදු මෙන්ම නිදන්ගත වකුගඩු රෝගයෙන් බලපෑමට ලක් වී ඇති ප්‍රදේශවල ආහාර බැර ලෝහවලින්

දූෂණයට ලක් වී ඇද්දැයි පරීක්ෂා කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කර ඇත. ආහාර සහ ආහාර පුරුදු ඇගයීම සඳහා මෙම අධ්‍යයනයෙන් අරමුණු කළද, නිදන්ගත වකුගඩු රෝගයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල බැර ලෝහ දූෂණය සහ නිදන්ගත වකුගඩු රෝගය සහ බලපෑමට ලක් වූ පුද්ගලයින්ගේ ආහාර සහ ආහාර රටා අතර හඳුනා ගත හැකි සම්බන්ධතාවක් පවතීද යන්න මෙමගින් සොයා බැලිණි.

ප්‍රශ්නාවලි **484**ක පමණ ප්‍රමාණයක් සම්පූර්ණ කරන ලදී. වකුගඩු රෝගය පැතිරී ඇති ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ආහාර රටා පිළිබඳ දැනුමක් මෙම අධ්‍යයනය තුළින් ලබා ගත හැකි වේ.

### 2.1.2. පෞද්ගලික අරමුදල් ලැබූ පර්යේෂණ ව්‍යාපෘති

**a). ශ්‍රී ලාංකික තත්ත්ව යටතේ ගබඩා පළිබෝධකයින් මත කෘමිනාශක අන්තර්ගත බෑගවල ජෛව සඵලත්වය**

ශ්‍රී ලාංකික තත්ත්ව යටතේ වී ගබඩා කර තැබීමේදී ඇති වන කෘමි හානි එරෙහිව කෘමිනාශක (deltamethrin) අන්තර්ගත බෑගවල (Zerofly) සඵලත්වය ඇගයීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. අනුරාධපුර පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේදී සහ වී අළෙවි මණ්ඩල ගබඩාවේදී අධ්‍යයනය සිදු කෙරිණි. සීරෝෆ්ලයි බෑගවල අසුරන ලද වී නියැදි ස්ථාන දෙකෙහිම අසුරා තබන ලද අතර පාලන පරීක්ෂණ සඳහා ප්‍රතිකාර නොකරන ලද පොලිසැක් බෑග යොදා ගැනිණි. ආරම්භක අවස්ථාවේදී සහ ගබඩාකරණ කලාපරිච්ඡේදය තුළ මාසික කාල අන්තරවලින් නියැදි ලබාගත් අතර තෙතමන ප්‍රමාණය, කෘමි හානි හේතුවෙන් ඇති වූ ස්කන්ධ හානිය, දහස් ධාන්‍ය ස්කන්ධය, ප්‍රරෝහණ ප්‍රතිශතය, මුළු සහල් එලදාව සහ ප්‍රධාන සහල් එලදාව සඳහා විශ්ලේෂණය කරන ලදී. සංඛ්‍යාන විශ්ලේෂණ පද්ධතියක් මගින්, විචල්‍යය විශ්ලේෂණය (ANOVA) කිරීම භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය කෙරිණි.

ගබඩාකරණ කාලපරිච්ඡේදය තුලදී වී වල තෙතමන ප්‍රමාණය 13.3% සිට 14.3% දක්වා වෙනස් වූ අතර ගබඩාකරණ බෑග වර්ග මත සැළකිය යුතු වෙනසක් නිරීක්ෂණය නොවිණි. ගබඩාකරණ කාලපරිච්ඡේදය තුළදී වීවල තෙතමන ප්‍රමාණය 13.3%-14.3% අතර උච්චාවචනය වුවද ගබඩාකරණ බෑග වර්ගය අනුව සැළකිය යුතු වෙනසක් නිරීක්ෂණය නොවිනි. ගබඩාකරණ කාලයත් සමඟ පාලකයෙහි කෘමි හානි මට්ට ඉහළ ගිය අතර ප්‍රතිකාර කරන ලද බෑගවල මුලින් තිබූ කෘමි හානිය නොවෙනස්ව පැවතිණි. ප්‍රතිකාර නොකරන ලද බෑගවල තිබූ ධාන්‍යවල කෘමි හානිය ප්‍රතිකාර කරන ලද බෑගවලවලට වඩා සැළකිය යුතු ලෙස වැඩි ($p=0.05$) විය. සීරෝෆ්ලයි බෑග භාවිතා කිරීමෙන් ගබඩාකරණ කාලපරිච්ඡේදයේදී කෘමි හානිය 3.51-4.38% කින් අඩු විය. ඊට අමතරව ගබඩාකරණ කාලපරිච්ඡේදය තුළදී කෘමිනාශක අන්තර්ගත බෑගවල මතුපිට මියගිය කෘමීන්ගේ ශරීර දක්නට ලැබුනු අතර ප්‍රතිකාර නොකරන ලද බෑගවල මතුපිට මියගිය හෝ ජීවත්වන කෘමීන් දක්නට නොලැබිණි. ප්‍රතිකාර නොකරන ලද බෑගවලින් ලබාගත් වී නියැදිවල

ප්‍රධාන වශයෙන් වී ගුල්ලා (*Sitophils oryza*) සහ කුඩා ධාන්‍ය ගුල්ලා (*Rhysopertha dominica*) දක්නට ලැබුනු අතර කෘමීන්ගේ ගණන කාලයත් සමඟ වැඩි විය. ප්‍රතිකාර කරන ලද බෑගවල තිබූ ධාන්‍යවල ප්‍රරෝහණ ප්‍රතිශතය පාලක නියැදිවලට වඩා සැළකිය යුතු ඉහළ අගයකින් යුක්ත විය. ලෙස විය. ප්‍රතිකාර කරන ලද බෑගවල එය 93% සිට 82-83% දක්වා අඩු වී ඇත. මාස හයක ( Thousand grain mass) සැළකිය යුතු වෙනසක් (p=0.05) දක්නට නොලැබිණි. ප්‍රතිකාර නොකරන ලද බෑගයන්හි වීවල TMY ( Total milling yield) සහ HRY (Head rice yield) අගයන් සීරෝෆලයි බෑගවල තිබූ වීවලට වඩා සැළකිය යුතු ලෙස අඩු (p=0.05) විය. කෘමිනාශක අන්තර්ගත බෑග භාවිතයෙන් ගබඩාකරණ කාලය තුළදී වීවල TMY සහ HRY හානිය අඩු කර ගත හැක. ගබඩාකර ඇති වී කෘමි හානි වලින් ආරක්ෂා කර ගැනීම සඳහා කෘමිනාශක අන්තර්ගත බෑග යෝග්‍ය ඇසුරුමක් වන බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

**b) අලුතින් නෙළාගත් වී වියළීම සඳහා ජංගම වියළන යන්ත්‍රයක් සකස් කිරීම.**

වර්තමානයේදී මහා පරිමාණයේ යාන්ත්‍රික කොළමඩින යන්ත්‍ර සහ සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍ර භාවිතය ඉහළ යෑම හේතුවෙන් නෙළා ගන්නා වීවල තෙතමන ප්‍රතිශතය 22%ක් වැනි ඉහළ අගයක පවතී. අතීතයේදී, ගොයම් කැපීමෙන් පසුව ගොයම් මිටි දින 2-3ක් කුඹුරෙහි තැබීම ප්‍රධාන වි වගා ප්‍රදේශවල අනුගමනය කරන ලද සාමාන්‍ය ක්‍රමය විය. මෙම ක්‍රමයෙන් ආරක්ෂාකාරිව වී ගබඩා කර තබා ගත හැකි මට්ටමට වී වියළා ගැනීමට ගොවීන්ට හැකියාව ලැබිණි. වර්තමානයේදී අස්වනු නෙළීම සඳහා සහ කොළමැඩීම එකවර ඉටු කිරිම සඳහා ඉහළ ධාරිතාවයකින් යුත් යාන්ත්‍රික කොළමඩින යන්ත්‍ර හෝ සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍ර භාවිතා කිරිම හේතුවෙන් මෙම ක්‍රමවේදය භාවිතයෙන් ඈත් වී ඇත.

මෙහි ප්‍රතිඵලයක් ලෙස සියළුම ප්‍රදේශවලින් නෙළා ගන්නා වී අස්වනුවල තෙතමන ප්‍රමාණය ඉහළ අගයත පවතින අතර එය වී පිරිසිදු කිරීම, ගබඩා කිරිම සහ සකස් කිරිම මෙන්ම පරිභෝජනය කිරීම සඳහාද බරපතල ගැටළුකාරී තත්ත්වයන් ඇති කර ඇත. යාන්ත්‍රික කොළමඩින යන්ත්‍ර හෝ සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍ර වී වගා ක්ෂේත්‍රය යාන්ත්‍රීකරණය සඳහා අත්‍යවශ්‍ය වන බැවින් ක්ෂේත්‍ර මට්ටමින් අනුමත කල හැකි මට්ටමට තෙතමන ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා අලුතින් නෙළා ගත් වී අස්වනු වියළීම සඳහා කාර්යක්ෂම සහ යාන්ත්‍රික ක්‍රමවේදයක පැවතීම අවශ්‍ය වේ.

ක්ෂේත්‍ර මට්ටමින් වියළීමේ පහසුකම් නොමැති වීම හේතුවෙන් ගොවීන් වී වියළීම නොකරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් වී වියළීමෙන් තොරව විකිණීම හෝ ගබඩා කිරීම සිදු කරනු ලැබේ. අලුතින් නෙළා ගත් වී වියළීම සිදු කරන්නේ මහා පරිමාණයේ සහල් මෝල්වල පමණක් වන අතර ඔවුන් සතුව කර්මාන්ත පරිශ්‍රයේ මහා පරිමාණ වී වියළීමේ යන්ත්‍ර පවතී. සාධාරණ

මිලකට වී වියළීමේ පහසුකම් පවතී නම් ගොවීන්ට කුලී පදනමින් මෙම පහසුකම් භාවිතා කල හැකි වේ.

කි.ග්‍රෑ. 1000ක ධාරිතාවයක් සහිත ජංගම වියළීමේ යන්ත්‍රයක් සකස් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. යාන්ත්‍රික කොළමඩින යන්ත්‍ර හෝ සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍ර මෙන් ගොවීන්ට සේවා ලබා දීම සඳහා සාධාරණ මිලකට මෙම වියළන යන්ත්‍රය කුලියට ලබා දීම සඳහා පෞද්ගලික අංශයද විකිණීමට හෝ ගබඩා කිරීමට පෙර වී වියළීම සඳහා ගොවීන්ද උනන්දු කරවීම මෙමගින් අපේක්ෂා කෙරේ. එබැවින්, ආසන්න වශයෙන් වරකට කි.ග්‍රෑ.1000ක ධාරිතාවයකින් යුත් සුදුසු කුඩා/මධ්‍යම පරිමාණයේ ජංගම වියළන යන්ත්‍රයක් හඳුන්වාදීම වැදගත් වේ. "පසු අස්වනු සහ කෘෂිකර්මාන්තයේ අගය එක් කිරීමේ පර්යේෂණවල ජාතික ප්‍රමුඛතා 2011-2015" හි ප්‍රමුඛතා 01 සහ 02 යටතේ මේ පිළිබඳව සඳහන් කර ඇත. වියළන යන්ත්‍රයෙහි පිරිසැකසුම සම්පූර්ණ කර ඇත.

**c). අඩු වියදම් ධාන්‍ය පිටි මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම**



දිවයිනෙහි තිරිඟු පිටි පරිභෝජනය අඩු කිරීම සඳහා ඇති එක් ප්‍රධාන විසඳුමක් වන්නේ මේ වන විටත් ඉහළ ඉල්ලුමක් පවතින බැවින්, සහල් පිටි සමඟ දේශීයව නිෂ්පාදනය කල ධාන්‍ය පිටි මිශ්‍රකර වෙළඳපොළට සහ ආහාර සකස් කරන්නන් වෙත හඳුන්වාදීම වේ. ඒකකාරව විසිරුනු අංශු සහිත පිටි මිශ්‍රණ නිෂ්පාදනය කිරීම සඳහා මිශ්‍රණ උපකරණ අත්‍යවශ්‍ය වේ. පිටි මිශ්‍රණ යන්ත්‍ර අන්තර්ජාතික වෙළඳපොළෙහි විකිණීමට ඇත. නමුත් ඒවායේ මිල ඉතා අධික වන අතර මධ්‍යම පරිමාණයේ පිටි නිෂ්පාදකයින්ට පවා මිලදී ගැනීම අසීරු ඉහළ මිල ගණන් වලින් යුක්ත වේ. එබැවින් පිටි නිෂ්පාදකයින් සඳහා හඳුන්වාදීම පිණිස මෙම ව්‍යාපෘතිය යටතේ අඩු වියදම් ධාන්‍ය

පිටි මිශ්‍ර කිරීමේ උපකරණයක් සැලසුම් කර සකස් කරන ලදී. පාන් සෑදීම සඳහා සාමාන්‍යයෙන් යොදා ගන්නා මිශ්‍රණ අනුපාතය වන සහල් පිටි සහ තිරිඟු පිටි 3:7 අනුපාතයට මිශ්‍ර කිරීම සඳහා සකස් කරන ලද ධාන්‍ය පිටි මිශ්‍රණ උපකරණය පරීක්ෂා කරන ලදී. උපකරණය මිනිත්තුවකට වාර 51ක වේගයකින් (51rpm) ක්‍රියාකරන අවස්ථාවේදී ඒකාකාරී මිශ්‍රණයක් සකස් කිරීම සඳහා ගතවන අවම කාලය වන විනාඩි 3ක් වන බව සොයාගන්නා ලදී. උපකරණයෙහි ධාරිතාවය වරකට කි.ග්‍රෑ.50ක් වූ අතර එය අශ්ව බල 3ක විදුලි මෝටරයකින් ක්‍රියාත්මක විය.

## පර්යේෂණ සහ ප්‍රකාශන

**දේශීය ජර්නල:**


1. **යූ.ජී. චන්ද්‍රජිත්., ඩී.එම්.එස්.පී. බණ්ඩාර., කේ.ජී.එල්.ආර්. ජයතුංග., බී.එම්.කේ.එස්. තිලකරත්න.,**ක්ෂණික සහල් නූඩ්ල්ස් (Cup Noodle) සකස් කිරීම සහ තත්ත්වය ඇගයීම 2014. පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 5-8.
2. **එච්.එස්. ජයවර්ධන., බී.එම්.කේ.එස්. තිලකරත්න.,**සහල් පිටි ආශ්‍රිත ගැඹුරු තෙලේ බදින ලද විස්කෝතුවක් සකස් කිරීම සහ එය ගබඩා කර තබා ගැනීමේ හැකියාව ඇගයීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 9-13.
3. **බී.එම්.කේ.එස්. තිලකරත්න., එම්.කේ.යූ. ආරච්චි.,කේ.එම්.එස්. විමලසිරි.,ඩී.ජී.එන්.ජී. විජේසිංහ.,**විජලනය කරන ලද මුරුංගා පත්‍ර යොදා ගත් පෝෂණ මිශ්‍රණයක් සකස් කිරීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 14-18
4. **බී.එම්.කේ.එස්. තිලකරත්න., ඒ.ඒ.එම්.ටී. ගුණසේකර., එන්.ඩබ්ලිව්.අයි.ඒ. ජයවර්ධන., ජී.ඒ.එස්. ගිනිගද්දර.,** මුරුංගා (*Moringa Oleifera*) පත්‍ර පදනම් කර ගත් පාන් තැවරුමක් සකස් කිරීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 33-41
5. **ඩී.පී.සී. ස්වර්ණසිරි.,** ශ්‍රී ලංකාවේ විවෘත වෙළඳපොළෙහි පවතින දේශීයව නිෂ්පාදනය කරන ලද සහල්වල තත්ත්වය ඇගයීම 2014: සිද්ධි අධ්‍යයනයකි 2012, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන්, පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 42-47.
6. **සී.ආර්. ගුණවර්ධන., ඩබ්ලිව්.එම්.සී.බී. වාසල., සී.ඒ.කේ. දිසානායක., ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන., යූ.ජී. චන්ද්‍රජිත්., බී.එම්.කේ.එස්. තිලකරත්න.,** ශ්‍රී ලංකාවේ ප්‍රධාන සැපයුම්දාමයන්හි එළවළු ප්‍රවාහනය සඳහා ආරක්ෂාකාරී ඇසුරුමක් යොදා ගැනීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 52-56
7. **ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන., ජී.ඩී. සෙනෙවිරත්න., එන්.ඩබ්ලිව්.අයි.ඒ. ජයවර්ධන., ටී.එම්.ආර්. දිසානායක., ඩබ්ලිව්.එම්.සී.බී. වාසල., බී.එම්.කේ.එස්. තිලකරත්න.,** ඇවමය ඇසුරුම් භාවිත කිරීමෙන් ලීක්ස් (*Allium porum*) ප්‍රවාහනය කිරීමේදී සිදු වන පසු අස්වනු හානිය අඩු කිරීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 57-61
8. **ඩබ්ලිව්.එම්.සී.බී. වාසල., සී.ආර්. ගුණවර්ධන., ඩබ්ලිව්.ඒ.එච්. චම්පා., ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන., ආර්.එම්.ආර්.එන්.කේ. රත්නායක., යූ.ජී. චන්ද්‍රජිත්., බී.එම්.කේ.එස්. තිලකරත්න.,** ශ්‍රී ලංකාවේ සැපයුම්දාම ක්‍රියාකාරකම් තුළදී කෙසෙල්වල පසු අස්වනු හානිය

සහ ගුණාත්මකභාවය පිරිහීම ඇගයීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 62-66

9. **ඩී.එම්.සී.සී. ගුණතිලක., කේ.බී. පලිපාන.,** ලොකු ලූනු ප්‍රමාණය අනුව වර්ග කිරීමේ යන්ත්‍රයක් ඇගයීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 67-72

10. **ඩබ්ලිව්.ඒ.එච්. චම්පා., ආර්.එම්.ආර්.එන්.කේ. රත්නායක., බී.එම්.කේ.එස් තිලකරත්න.,** මඤ්ඤොක්කාවල (Manihot esculenta Crantz), රාක්ක ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් සකස් කිරීම2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 73-78

11. **ඩබ්ලිව්.ඒ.එච්. චම්පා., එම්.අයි.එස්. ගිල්., බී.වී.සී. මහජාන්., එන්.කේ. ඇරෝරා., එස්. බෙඩි.,** 2014, ඇට රහිත ගිනිදැල්ල ලෙස හඳුන්වන මිදිවල (*vitis vinifera L.*) තත්ත්වය (berry quality) ඉහළ නැංවීම සඳහා පෙර අස්වනු සමයේදී සැලිසිලික් අම්ලය පත්‍රමත ඉසීම පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 88-92

12. **ආර්.එම්.ආර්.එන්.කේ. රත්නායක., ඩබ්ලිව්.එම්.සී.බී. වාසල., සී.ඒ.කේ. දිසානායක., සී.ආර්. ගුණවර්ධන., යූ.ජී. චන්ද්‍රජිත්., බී.එම්.කේ.එස්. තිලකරත්න.,** *Collettotichum cocodes* විසින් ඇති කරන තක්කාලි ඇන්ත්‍රැක්නෝස් මෘදු කුණුවීමේ රෝගය සඳහා සෝඩියම් බයිකාබනේට් සහ ඇමෝනියම් බයිකාබනේට් වල බලපෑම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 93-98

13. **ඩී.එම්.එස්.පී. බණ්ඩාර., සී.ආර්. ගුණවර්ධන., ටී.එම්.ආර්. දිසානායක., බී.එම්.කේ.එස්. තිලකරත්න., එච්.එම්.ජේ.පී. රත්නායක.,** සහල් පිටිවල තත්ත්වය ඉහළ නැංවීම මත පෙර-ජෙලටිනීකරණයේ කාර්ය භාරය,2014 පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 99-103

14. **ටී.එම්.ආර්. දිසානායක., ඩී.එම්.එස්.පී. බණ්ඩාර., එච්.එම්.ජේ.පී. රත්නායක., ඩී.පී. සේනානායක.,** අඛණ්ඩ වර්ගයේ වී උඳුනක් සකස් කිරීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 132-135

15. **එච්.එම්.ජේ.පී. රත්නායක., ටී.එම්.ආර්. දිසානායක., ඩී.එම්.එස්.පී. බණ්ඩාර., ඩී.පී. සේනානායක., සහ බී.එම්.කේ.එස්. තිලකරත්න.,** සහල් පිටි කර්මාන්තය සඳහා බලශක්ති කාර්යක්ෂම කම්පනයවන පිටි ෂිෆ්ටරයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 136-139

16. **බී.ඩී.එම්.පී. දිසානායක., එච්.එස්. ජයවර්ධන., සහ බී.එම්.කේ.එස්. තිලකරත්න.,** අඩු වියදම් ධාන්‍ය පිටි මිශ්‍රණ උපකරණයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම,2014 පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 140-145

17. **ඩී.පී. සේනානායක., එච්.එම්.ජේ.පී. රත්නායක., බී.ඩී.එම්.පී. බණ්ඩාර., සහ ටී.එම්.ආර්. දිසානායක.,** පාදයෙන් සහ මෝටරයකින් ක්‍රියාකරවිය හැකි වී පිරිසිදු කිරීමේ යන්ත්‍රයක් සකස් කිරීම සහ අත්හදා බැලීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 146-150

18. **එච්.එම්.ජේ.පී. රත්නායක., ඩී.පී. සේනානායක., බී.ඩී.එම්.පී. බණ්ඩාර., ඩී.එම්.එස්.පී. බණ්ඩාර., කේ.බී. පලිපාන., සහ බී.එම්.කේ.එස්. තිලකරත්න.,** මධ්‍යම පරිමාණයේ ප.අ.තා.ආ. බඩඉරිඟු ඇට වෙන්කිරීමේ යන්ත්‍රයක් ඇගයීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 151-154
19. **ඩී.පී. සේනානායක., එච්.එම්.ජේ.පී. රත්නායක., බී.එම්.කේ.එස්. තිලකරත්න., බී.ඩී.එම්.පී. බණ්ඩාර., සහ ටී.එම්.ආර්. දිසානායක.,** බඩඉරිඟුවල විශාලත්වය අඩු කිරීම සඳහා රාස්ප දණ්ඩ මෝල ඇගයීම 2014, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාව, පිටු අංක 155-159
20. **ආර්.එම්.එන්.ජේ. විජේවර්ධන., එච්.එස්. ජයවර්ධන., ඩබ්ලිව්.එම්.සී.බී. වාසල., බී.එම්.කේ.එස්. තිලකරත්න.,** විජලනය කරන ලද බෙලි (Aegle marmelos) කුඩු යොදාගනිමින් ක්ෂණික බීමක් සකස් කිරීම සහ එහි තත්ත්වය ඇගයීම 2014, කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි කාර්ය සටහන්, රුහුණු විශ්වවිද්‍යාලය, නොවැ. 29
21. **බී.ඩී.එම්.පී. බණ්ඩාර., සී.ආර්. ගුණවර්ධන., ඩී.පී. සේනානායක., බී.එම්.කේ.එස්. තිලකරත්න.,** කුඩා පරිමාණයේ වී වියළන යන්ත්‍රයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම, කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි (ISAE 2014) කාර්ය සටහන්, රුහුණු විශ්වවිද්‍යාලය, පිටු අංක 347-349
22. **බී.ඩී.එම්.පී. බණ්ඩාර., සී.ආර්. ගුණවර්ධන., ඩී.පී. සේනානායක., බී.එම්.කේ.එස්. තිලකරත්න.,** කාණ්ඩ වර්ගයේ බඩඉරිඟු වියළීමේ යන්ත්‍රයක් සකස් කිරීම සහ ඇගයීම, කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි (ISAE 2014) කාර්ය සටහන්, රුහුණු විශ්වවිද්‍යාලය, පිටු අංක 351-353
23. **යූ.ජී. චන්ද්‍රජිත්., ඩී.එම්.සී.සී. ගුණතිලක., බී.ඩී.එම්.පී. බණ්ඩාර., ඩී.පී.සී. ස්වර්ණසිරි.,** සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍රයෙන් වී අස්වනු නෙළීමෙන් බීජ ප්‍රරෝහණය මත ඇතිකරන බලපෑම, කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි (ISAE 2014) කාර්ය සටහන්, රුහුණු විශ්වවිද්‍යාලය, පිටු අංක 365-367

## 3.0 සංවර්ධන ව්‍යාපෘති

තාක්ෂණික ක්‍රමවේද යෙදවීම සහතික කිරීම පිණිස 2014 වර්ෂය තුළදී ප.අ.තා.ආ. විසින් සිදු කර ඇති සංවර්ධන ව්‍යාපෘති සහ පසු අස්වනු කර්මාන්තයෙහි ඒවායේ බලපෑම පහත විස්තර කර ඇත:

### 3.1 ප.අ.තා.ආ. අරමුදල් යටතේ සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති.

#### 3.1.1. පාසල් ළමුන් අතර සහල් ආශ්‍රිත නිෂ්පාදන ජනප්‍රිය කරවීම සඳහා පාසල් ආපනශාලා හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

වර්තමාන සමාජ පද්ධතියෙහි මිනිසුන් ඉහළ තරඟකාරී ජීවන රටාව සහ අසීමිත ආශාවන්, අවශ්‍යතාවයන් සහ බලාපොරොත්තු වෙනුවෙන් තමන්ගේ මුදල් සහ ශක්තිය යොදවනු ලැබේ. එබැවින් අසීමිත නිදහසක් භුක්ති විඳි එක්ව බැඳුනු පවුල් පසුබිම, ආතතිය සහ සීමිත නිදහසක් සහිත න්‍යෂ්ටික පවුල් පසුබිමක් දක්වා වෙනස් වී ඇත. ඒ හේතුවෙන් පවුලක් ලෙස ආහාර පිළියෙල කිරීමේ සහ ආහාර ගැනීමේ පුරුදු, නිවසින් බැහැරව පිළියෙල කරන ක්ෂණික ආහාර ලබා ගැනීම දක්වා

වෙනස් වී ඇත.බොහෝවිට තිරිඟු පිටිවලින් සකස් කරනු ලබන එවැනි ක්ෂණික ආහාරවල සෞඛ්‍යමය ප්‍රතිලාභ ඉතා අඩු වේ. බොහොමයක් සෞඛ්‍ය ප්‍රතිලාභවලින් තොර මේ ආකාරයේ ක්ෂණික ආහාරවලට ළමුන් වැඩි ප්‍රියතාවයක් දක්වයි. ආහාර වලින් වැඩි සංඛ්‍යාවක් සෞඛ්‍ය සහ ආහාර සුරක්ෂිතතා නියාමනයන් උල්ලංඝනය කරනු ලබන අතර එබැවින් හෘද රෝග, දියවැඩියාව, පිළිකා ආශ්‍රිත රෝග, අම්ලපිත්ත රෝග ජනතාව අතර බහුල පැතිරී ඇත.

පාසල් ළමුන්ගෙන් 15%ක් පමණ උසට සරිලන බරට වඩා වැඩි බරකින් යුක්ත වන අතර දියවැඩියාවෙන් පෙළීම, උපදින ළදරුවන් 6 දෙනෙකුගෙන් එක් ළදරුවෙකු අඩු බරින් යුක්ත වීම, ළමුන්ගෙන් 13%ක් සම්මත උසට වඩා උසින් අඩු වීම, වසර 5ට වඩා අඩු වයසින් යුත් ළමුන්ගෙන් ¼ ක් අඩු බරින් යුක්ත වීම සහ මරණවලින් 65%ක් බෝ නොවන රෝගවලින් සිදු වීම වර්තමාන ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය මුහුණ දී ඇති අභියෝග සමහරකි.සෞඛ්‍ය තත්ත්වයේ මෙම පිරිහීමට ව්‍යායාම නොමැති වීම, මානසික ආතතිය, ස්ථුලතාවය, ආහාර රටා ආදිය හේතු වී ඇත..

මෙම ජාතික ගැටළුව හඳුනාගත් අධ්‍යාපන අමාත්‍යාංශය පාසල් ආපනශාලාවල මෙම ආහාර විකිණීම තහනම් කරන ලදී. අපගේ ප්‍රධාන ආහාරය බත් වන බැවින්, සහල් ආශ්‍රිත නිෂ්පාදන ළමුන් අතර ජනප්‍රිය කරවීම මෙම ගැටළු සඳහා එක් විසඳුමක් වනු ඇත. මේ සම්බන්ධයෙන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතන විසින් ආහාර නිෂ්පාදන රාශියක් සකස් කර ඇති බැවින් සහල් ආශ්‍රිත ආහාර නිෂ්පාදන පාසල් ආපනශාලා අතර ජනප්‍රිය කරවීමේ හැකියාවක් පවතී.

| පුහුණු කාණ්ඩය | ස්ථානය/දිස්ත්‍රික්කය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| ආපනශාලා හිමියන් | අනුරාධපුරය | 24 |
| ආපනශාලා හිමියන් | පේරාදෙණිය, මහනුවර | 25 |
| ආපනශාලා හිමියන් | කෝනාර, අම්පාර | 92 |
| ආපනශාලා හිමියන් | DOA , පොළොන්නරුව | 32 |
| ආපනශාලා හිමියන් | කලාප අධ්‍යාපන, අම්පාර | 30 |
| ආපනශාලා හිමියන් | DS පාසල, අම්පාර | 26 |
| ආපනශාලා හිමියන් | පුතුකුඩිඉරුප්පු, මුලතිව් | 30 |
| ආපනශාලා හිමියන් | මීගෙදර පාසල,ගාල්ල | 106 |
| ආපනශාලා හිමියන් | පරදූව පාසල,මාතර | 79 |
| ආපනශාලා හිමියන් | පුත්තලම | 26 |
| ආපනශාලා හිමියන් | ආනමඩුව,පුත්තලම | 26 |
| ආපනශාලා හිමියන් | විදාතා,කොත්මලේ,නුවරඑළිය | 19 |
| ආපනශාලා හිමියන් | විදාතා,කොත්මලේ,නුවරඑළිය | 25 |
| එකතුව | | 484 |

මෙම ව්‍යාපෘතිය යටතේ පුහුණු වැඩසටහන් 18 ක් පවත්වා පාසල් ආපනශාලා හිමියන් 484 දෙනෙකු පුහුණු කර ඇත.

### 3.1.2. විශිෂ්ට තත්ත්වයේ සහල් මිලදී ගැනීම සහ පරිභෝජනය ඉහළ නැංවීම සඳහා සහල් අළෙවි සැල් සංවර්ධනය කිරීම.

ශ්‍රී ලාංකික වෙළඳපොළෙහි සහල් සඳහා ප්‍රමිතිකරණයක් නොමැත. පාරිභෝගික අභිමතය අනුව සහල් මිලදී ගත හැක. වෙළඳපොළෙහි විවිධ වර්ගයේ සහල්ද පවතී. මෙම සහල් විශේෂ ශ්‍රේණිය, 1 ශ්‍රේණිය, 2 ශ්‍රේණිය, 3 ශ්‍රේණිය ලෙස ප්‍රමිතකරණය කලහොත් සහල් සඳහා වැඩි පාරිභෝගිත පිළිගැනීමක් සහ විශ්වාසයක් ලබා ගත හැකි වේ. මෙම දැනුම සහල් නිෂ්පාදකයින් සහ වෙළෙන්දන්ට ලබා දිය යුතු වේ. ඉන් පසු ඔවුන්ට විදේශ වෙළඳපොළට පවා පිවිසිය හැකි වේ.

ඉහළ පෝෂණ ගුණයක් සහිත දේශීය සහල් ජනප්‍රිය කරවීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මේ දිනවල සිදු කරමින් සිටී. සහල් වලට හරවන ලද මෙම වී සඳහා විශාල වෙළඳපොළ විභවයක් පවතී. මාර්ගය දෙපස විකිණීමට ඇති ග්‍රාමීය නිෂ්පාදන සඳහා ඉහළ වෙළඳපොළ ඉල්ලුමක් පවතී. එබැවින්, ව්‍යාපෘතිය හරහා මෙම වෙළඳසැල් හඳුනාගෙන දිවයින පුරා එවැනි දේශීය සහල් නිෂ්පාදන ජනප්‍රිය කරවීම සඳහා ඔවුන්ට උපදෙස් ලබා දීම එක් ව්‍යාපෘති අරමුණක් විය.

වර්තමානයේදී පාරිභෝගිකයින් ගුණාත්මක සහල් සඳහා වැඩි කැමැත්තක් දක්වයි. එබැවින් ඉහළ තත්ත්වයේ සහල් වැඩි මිලකය අළෙවි කල හැකි වන අතර සාමාන්‍ය සහල් අළෙවි කල හැකි වන්නේ අඩු මුදලකට වේ. පාරිභෝගිකයාගේ පැත්තෙන් යුක්ති සහගත මුදලකට වඩාත් හොඳ සහල් මිලදී ගත හැකි වේ. මෙම ව්‍යාපෘතිය යටතේ එක් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්සියගම සහ පොල්පිතිගම පුද්ගලයින් 30 දෙනෙකු පුහුණු කරන ලදී.

### 3.1.3.දේශීයව නිෂ්පාදනය කරනු ලබන සහල්වල තත්ත්වය අන්තර්ජාතික ප්‍රමිතිය දක්වා වැඩි දියුණු කිරීම

අන්තර්ජාතික මෙන්ම කලාපීය වෙළඳ ගිවිසුම් සඳහා එක් වෙමින් එමඟින් ඒවායේ වෙළඳපොළ ලෝකයට විවෘත කරගන්නා වෙනත් බොහොමයක් රටවල් මෙන් සහල් වල තත්ත්වය වැඩිදියුණු කර ගැනීම ශ්‍රී ලංකාවට අනාගතයේදී වඩාත් වැදගත් වනු ඇත.

විවෘත වෙළඳපොළෙහි පවතින දේශීයව නිෂ්පාදනය කල සහල් වල තත්ත්වය ඇගයීම සඳහා මෑතකදී ප.අ.කා.ආ. විසින් පවත්වන ලද සමීක්ෂණයේදී බොහොමයක් සහල් මෝල් වලින් නිෂ්පාදනය කරනු ලබන සහල් වල තත්ත්වය අන්තර්ජාතිත ප්‍රමිතවල අවශ්‍යතාවයන්ට වඩා අඩු මට්ටමක පවතින බව අනාවරණය වී ඇත.

කැඩුනු ධාන්‍ය සහ වී ඇට විශාල ප්‍රමාණයක් පැවතීම, විවිධ වර්ගයන් කළවම් වීම, අපද්‍රව්‍ය, හානි වූ සහ අවපැහැ ගැන්වුනු ධාන්‍ය සහ පොතු ඉවත් කිරීමේ ඒකාකාරී භාවයක් නොමැති වීම සහල්වල තත්ත්වය බාල වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇති සාධක වේ.

දේශීය සහල් මෝල් වල සහල් සැකසීමේ මට්ටම් ඉහළ නැංවීමේ සහ සහල් වල තත්ත්වය වැඩිදියුණු කර ගැනීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය (ප.අ.තා.ආ.) විසින් පවතින සහල් මෝල් වල සකස් කිරීමේ තාක්ෂණික ක්‍රමවේද පහත සඳහන් ක්‍රියාකාරකම් තුලින් වැඩිදියුණු කිරිම සඳහා වැඩසටහනක් ආරම්භ කර ඇත:

සහල් සැකසීමේ ක්‍රියාවලියේදී වර්තමානයේ යොදාගන්නා තාක්ෂණික ක්‍රමවේද වල ඌනතාවයන් හඳුනාගැනීම, වැඩිදියුණුකල සහල් සැකසීමේ තාක්ෂණික ක්‍රමවේද පිළිබඳව පුහුණු වැඩසටහන් මාලාවක් පැවැත්වීම, යාන්ත්‍රික අංශයේ දැනුම ඉහළ නැංවීම, යන්ත්‍රසූත්‍ර විධිමත්ව නඩත්තු කිරීම, අමුද්‍රව්‍ය තෝරා ගැනීම, යෝග්‍ය ගබඩා කිරීමේ ක්‍රමවේද ආදිය, ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

එමෙන්ම ශක්‍යතා වාර්තා සකස් කිරීමේදී සහල් මෝල් හිමිකරුවන්ට සහාය වීම, කාර්යාවලියේ පිරිසැලසුම්, යන්ත්‍රසූත්‍ර සහ ගොඩනැගිලි අවශ්‍යතා සැපයීම, සහල් මෝල් වල කාර්ය සාධනය නොකඩවා ඇගයීමද මෙම වැඩසටහනට අයත් වේ.

මෙම වැඩසටහන යටතේ 2014 වර්ෂයේදී, තාක්ෂණික උපදෙස් ලබා දීමෙන් ප.අ.තා.ආ. විසින් සහල් මෝල් 12ක් සංවර්ධනය කර ඇත. සහල් මෝල් වල සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් යටතේ ගැනෙන, විධිමත් ක්‍රියාවලි පෙළක් සැකසීම, ගල්වැලි ඉවත්කරනය (de-stoner) හෝ අනුක්‍රමකය (grader) වැනි නව යන්ත්‍රසූත්‍ර ස්ථාපිත කිරීම, වී තැම්බීමේ තාක්ෂණික ක්‍රමවේද සහ වියළීමේ පහසුකම් වැඩිදියුණු කිරිම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම සඳහා පුහුණු පාඨමාලා පවත්වන ලදී. මඩකලපුව, අම්පාර (දමන), අඹන්පොළ (කුරුණෑගල), හම්බන්තොට (ලුනාම), මාතර, පුනරීන් සංවර්ධනය කිරීම සඳහා සලකා බලන ලද ප්‍රධාන ප්‍රදේශ විය. මෙම ව්‍යාපෘතිය යටතේ සහල් මෝල් හිමියන් 152 පුහුණු කරන ලදී.

### 3.1.4 ග්‍රාමීය ප්‍රදේශවල සහල් ආශ්‍රිත නිපැයුම් නිෂ්පාදනය කිරීමේ ක්ෂුද්‍ර- ව්‍යවසායන් ආරම්භ කිරීම

සහල් කේක්, විස්කෝතු, මුරුක්කු වැනි සහල් ආශ්‍රිත ආහාර වර්ග සහ සහල් පොරි ආශ්‍රිත නිෂ්පාදන ජනප්‍රිය කරවීම සහ ආරම්භ කිරීම සඳහා මෙම සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. දැනුවත්භාවයක් නොමැති විම හේතුවෙන් සහල් ආශ්‍රිත ඉහත ආහාර වර්ග පරිභෝජනය ඉතා පහළ මට්ටමක පවතී. එක් එක් පුහුණු වැඩසටහන යටතේ තාක්ෂණික දැනුම, ප්‍රායෝගික ඉදිරිපත් කිරීම් සමඟින් පුහුණුවන්නන් වෙත පවරා දෙන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම,නොච්චියාගම සහ ළිඳවැව, මාතර දිස්ත්‍රික්කයේ තල්පාවිල, අම්පාර දිස්ත්‍රික්කයේ ලුණුගම, උදයපුර, වඩිනාගල සහ මොරගහපල්ලම, මන්නාරම් දිස්ත්‍රික්කයේ කට්ටායියදම්පන්, මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට, පුත්තලම දිස්ත්‍රික්කයේ දන්කොටුව, නුවරඑළිය දිස්ත්‍රික්කයේ රිකිල්ලගස්කඩ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ආදී ප්‍රදේශවල පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ඉහත වැඩසටහන් 14 යටතේ ප්‍රතිලාභීන් 597 දෙනෙකු පුහුණු කරන ලදී.

**3.1.5. ගොවියාගේ ආදායම ඉහළ නැංවීම සඳහා ගොවිපළ මට්ටමේ ගෘහස්ථ වී ගබඩා කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම (ආහාර සුරක්ෂිතතාවය සඳහා ග්‍රාමීය මට්ටමින් ධාන්‍ය ගබඩාකරණය)**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය මත යැපෙන අතර ප්‍රධාන භෝගය වී වන අතර ප්‍රධාන ආහාරය බත් වේ. ආහාරවලින් ස්වයංපෝෂිත වීමට රටකට ඇති අරමුණ සමඟ සහල් නිෂ්පාදනය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා උත්සාහයන් රාශියක් දරා ඇත. ඉන් සමහරක් වන්නේ පොහොර සහනාධාරය ලබාදීම, ප්‍රධාන සහ කුඩා වාරිමාර්ග පද්ධති සංවර්ධනය කිරීම, ඉහළ අස්වැන්නක් සහිත ප්‍රභේද සහ ව්‍යාප්ති සේවා ලබාදීම වේ. සහල් නිෂ්පාදනය වැඩි වුවද, අස්වනු නෙළන කාලයේදී ගොවිපොළ මට්ටමේ මිල ගණන් පහළ යෑම සහ ඉහළ නිෂ්පාදන පිරිවැය හේතුවෙන් වර්තමානයේ ගොවියාගේ පවුලේ ආදායම සතුටුදායක මට්ටමක නොපවතී. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් යල සහ මහ ලෙස හඳුන්වන වී වගා කරනු ලබන කන්න දෙකක් පවතී. වී වගා කරනු ලබන ප්‍රදේශ බොහොමයක වී අස්වනු නෙළන කාලය බොහෝවිට එකම කාලවකවානුව වේ. එබැවින්, අස්වනු නෙළන කාලසීමාවේදී ඉහළ නිෂ්පාදනය හේතුවෙන් වී මිල ඉතා අඩු තත්ත්වයක පවතී. වී ගබඩාකර තැබීමේදි සිදු වන පසු අස්වනු හානියද ප්‍රමාණාත්මකව 4%-6% ක් වන බව හඳුනාගෙන ඇති අතර සැළකිය යුතු ගුණාත්මක හානියක්ද සිදු වේ. අවිධිමත් ගබඩාකරණ ක්‍රමවේද, පළිබෝධ, පුස්, කෘදන්තයින් සහ සමහර ජෛවරසායනික ප්‍රතික්‍රියා හේතුවෙන් සිදු වන හානි බරපතල තත්ත්වයේ පවතී. වී ගොවියාගේ ආදායම ඉහළ නැංවීම සඳහා එක් විසඳුමක් ලෙස, මාස කිහිපයකට වී ගබඩා කර තබා ගැනීම යෝජනා කළ හැක්කේ අවාරයේදී වී සඳහා වෙළඳපොළ ඉල්ලුම මෙන්ම මිල ගණන්ද සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බැවිනි. විධිමත් භාවිතයන් අනුව වී ගබඩා කර තැබීමට ගොවීන් පුහුණුකර උනන්දු කලහොත් ඔවුන්ට දීර්ඝ කාලයක් නිෂ්පාදනයෙහි තත්ත්වය පවත්වා ගෙන යා හැකි වේ. එබැවින්, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ගොවි පොළ මට්ටමේ ගෘහස්ථ වී ගබඩා කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් වන අතර එමගින් වී ගොවීන්ට ඔවුන්ගේ ආදායම ඉහළ නංවා ගත හැකි වන අතරම වී වගාවෙන් ඉහළ ලාභයක්ද උපයාගත හැකි වනු ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම, කහටගස්දිගිලිය සහ ගල්නෑව, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කොටවෙහෙර, මැදිරිගිරිය සහ කුසුම්පොකුණ, අම්බලන්තොට දිස්ත්‍රික්කයේ රුහුණුලියගස්තොට, මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩුඉරුප්පු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිවුලන්කඩවල, අම්පාර දිස්ත්‍රික්කයේ

උහන, දමන සහ මොරගස්පල්ලම, මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉවනායිහාප්පුකුලම සහ මුල්ලිකුලම යන ප්‍රදේශවල වැඩසටහන් 10ක් ක්‍රියාත්මක කරන ලද අතර පුද්ගලයින් 466 පුහුණු කර ඇත.

### 3.1.6. සහල් පිටි කෙටීමේ කර්මාන්තය වැඩිදියුණු කිරීම

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය (ප.අ.තා.ආ.), සහල් පිටි නිෂ්පාදන කිරීම පිළිබඳ පර්යේෂණ, පුහුණු සහ වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම්වල නියැලී සිටින අතර සියළුම තාක්ෂණික සහාය ලබා දීම තළින් සහල් පිටි කර්මාන්තයේ ගැටළු විසඳීම සඳහා දායකත්වය ලබා දී ඇත. ඉහත අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ප.අ.තා.ආ. දියත් කර ඇති එක් ප්‍රධාන ව්‍යාපෘතියකි "සහල් පිටි කර්මාන්තය වැඩි දියුණු කිරීම" ව්‍යාපෘතිය. මෙම ව්‍යාපෘතිය යටතේ ඉහළ තත්ත්වයේ සහල් පිටි නිෂ්පාදනය කිරීමට හැකියාව ලැබෙන පරිදි නව සහල් පිටි සකස් කිරීමේ ඒකක ආරම්භ කිරීමටත් පවතින සහල් පිටි සැකසීමේ ඒකක නවීකරණය කිරීමටත් ඒ සඳහා බලාපොරොත්තු වන පුද්ගලයින් උනන්දු කරවමින් සහල් පිටි සැකසීමේ ඒකක පිහිටුවනු ලැබේ.

ඉහත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සහල් පිටි මෝල් හිමියන් සහ උනන්දුවක් දක්වන පුද්ගලයින් සඳහා "උසස් තත්ත්වයේ සහල් පිටි කෙටීමේ තාක්ෂණය" පිළිබඳ පුහුණුවීම් 4ක් කල්තොට, ගන්නොරුව, නුවරඑළිය සහ මඩකලපුව යන ප්‍රදේශවල පවත්වා ඇත. පුද්ගලයින් 115 දෙනෙකු ඒ සඳහා සහභාගී වී ඇත. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ සහල් මෝල් 20ක් නවීකරණය කර/පිහිටුවා ඇත.

### 3.1.7. ග්‍රාමීය මට්මින් කුළුබඩු සැකසීමේ කර්මාන්තය හඳුන්වාදීම

2014 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය මගින් මෙම කර්මාන්තය ආරම්භ කිරීමට අවශ්‍ය වූ ව්‍යවසායකයින්ට සහ පවත්වාගෙන යනු ලබන කර්මාන්තය වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය වූ ව්‍යවසායකයින්ට තාක්ෂණය පැවරීමට අපට හැකියාව ලැබිණි. 2014 වර්ෂය තුළදී පුහුණු වැඩසටහන් සංවිධානය කරමින් මහනුවර දිස්ත්‍රික්කයේ ගන්නොරුව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුනුවැව, කොළඹ දිස්ත්‍රික්කයේ IDB-මොරටුව, මුලතිව් දිස්ත්‍රික්කයේ තුනුක්කායි, අම්පාර දිස්ත්‍රික්කයේ දමන, වඩිනාගල සහ මහවල යන ප්‍රදේශ ආවරණය කිරීමට අපට හැකියාව ලැබිණි. කුළුබඩු නිෂ්පාදන සකස් කරන ආකාරය, ගුණාත්මකව ඇසුරුම් කරන ආකාරය පිළිබඳව ප්‍රායෝගික ඉදිරිපත් කිරීම් සමඟ දේශන පවත්වන ලද අතර මුද්‍රිත පොත් බෙදාදීමද සිදු කරන ලදී. කුළුබඩු සකස් කිරීමේ තාක්ෂණය සම්බන්ධයෙන් වැඩසටහන් 8ක් පවත්වා පුද්ගලයින් 314 දෙනෙකු පුහුණු කරන ලදී. මෙම වර්ෂයේදී නව කුළු බඩු සැකසීමේ ඒකක 03ක් ආරම්භ කිරීමට හැකිවිය.

### 3.1.8. ග්‍රාමීය මට්ටමින් පලතුරු ආශ්‍රිත නිපැයුම් නිෂ්පාදනය කිරීමේ ක්ෂුද්‍ර ව්‍යවසායන් ආරම්භ කිරීම

පලතුරු සහ එළවළු විශේෂයෙන් විටමින්, ඛණිජ ලවණ, ආහාරමය තන්තු සහ ප්‍රතිඔක්සිකාරක වල ප්‍රභවයන් ලෙස මානව පෝෂණයේ වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලබන අතර ආශ්‍රිත සෞඛ්‍යමය

ප්‍රතිලාභ හේතුවෙන් දිනපතා විවිධ වර්ගයේ පලතුරු වැඩියෙන් පරිභෝජනය කිරීම ඉහළින් නිර්දේශ කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ කෘෂි කාලගුණය, පුළුල් පරාසයක නිවර්ථන, අර්ධ නිවර්ථන සහ ඉහළ වෙළඳ පොළ විභවයක් සහිත සමහර සමශීතෝෂ්ණ පළතුරු සඳහා සුදුසු වුවද අවිධිමත් සැපයුම් දාම සහ වටිනාකම් දාම ක්‍රියාකාරකම් හේතුවෙන් 30-40% දක්වා වූ අස්වනු ප්‍රමාණයක් පශ්චාත් අස්වනු අවධියේදී හානියට පත් වේ. මෙම ප්‍රමාණය දූප්පත්කම, බඩගින්න සහ මන්දපෝෂණය අවම කිරීම සඳහා යොදාගැනීමට හැකියාව පවතින අතරම ඒවා දිවයිනෙහි අපනයන ආදායම ඉහළ නංවා ගැනීම සඳහා ද යොදා ගත හැකි වේ. අනෙක් අතට, ග්‍රාමීය වගා අංශයෙහි ආදායම් ඉපැයීමේ ක්‍රමවේද පිළිබඳ දැනුමක් නොමැති වීම හේතුවෙන් ඇති වී තිබෙන අඩු ආදායම් මට්ටම ඉක්මනින් විසඳිය යුතුව ඇති ප්‍රධාන ගැටළුවකි.
මෙම තත්ත්වය තුළ ග්‍රාමීය ප්‍රදේශයන්හි නිෂ්පාදනය කරන පලතුරු පරිහරණය කිරීම සහ සැකසීම සඳහා සුදුසු ක්‍රමවේද සකස් කිරීම ව්‍යාපෘතියෙන් අරමුණු කරන ලදී. එබැවින්, අවසානයේදී පලතුරුවල පශ්චාත් අස්වනු හානිය අවම කරවීම සඳහා මඟ පෙන්වන පලතුරු පරිහරණය කිරීමේ සහ සැකසීමේ ක්‍රියාකාරකම් වැඩිදියුණු කරන අතරම ග්‍රාමීය මට්ටමින් ආදායම් ඉපැයීමේ කෘෂි-පදනම් ක්ෂුද්‍ර ව්‍යවසායන් ආරම්භ කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

ආරම්භයේදී අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, හම්බන්තොට, මොණරාගල, යාපනය, මන්නාරම සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක 08 කින් ගොවි ප්‍රජා තෝරා ගන්නා ලදී. පුහුණු වැඩසටහන් 11 ක් පවත්වා ප්‍රතිලාභීන් 397ක් පුහුණු කරන ලදී. පුහුණු වැඩසටහන්, මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩුඉරුප්පු, ගාල්ල දිස්ත්‍රික්කයේ දූවේගොඩදෙණියගම සහ පොඩිවැලනියගම, පුත්තලම දිස්ත්‍රික්කයේ ආනමඩුව සහ මහදිවුල්වැව, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කදුරුවෙල, අම්පාර දිස්ත්‍රික්කයේ දමන ප්‍රා.ලේ. කාර්යාලය, උදයපුර සහ සුභදගම, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගිනිගත්හේන, අම්පාර දිස්ත්‍රික්කයේ තුන්වන පාලම, කෙත්සිරිගම සහ මොරගහපල්ලම, සහ යාපනය දිස්ත්‍රික්කයේ මීසාලෙයි යන ප්‍රදේශයන්හි පවත්වන ලදී.

### 3.1.9 පලතුරු ඉදවීමේ ඒකක පිහිටුවීම සහ පලතුරු වෙළඳසැල් නවීකරණය කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම.

පලතුරු අළෙවි කිරීමේ නියැලී සිටින පුද්ගලයින් අතර පලතුරු ඉදවීම සඳහා නිවැරදි සහ ආරක්ෂාකාරී ක්‍රමවේද භාවිතා කිරීම සම්බන්ධයෙන් සහ නිවැරදි පසු අස්වනු භාවිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනුවත්භාවයක් ඇති කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. නිවැරදි ක්‍රමවේද අනුව ඔවුන්ගේ පලතුරු වෙළඳසැල් නවීකරණය කිරීම සඳහාද එමගින් පලතුරු වෙළෙන්දන්හට (වෙළඳසැල් හිමියන්) පහසුකම් සැපයේ.

මෙම ව්‍යාපෘතිය යටතේ, කෘත්‍රිම පලතුරු ඉදවීමේ නිවැරදි ක්‍රමවේද භාවිතය, පලතුරු ඉදවීමේ ඒකක පිහිටුවීම සඳහා තාකෂණය ලබා දුන් අතර පලතුරු වෙළඳසැල් නවීකරණය කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම සිදු කරන ලදී.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමෙන්, පලතුරු ඉදවීම සඳහා නිවැරදි ක්‍රමවේද යොදා ගැනීමට පුද්ගලයින් යොමු කිරීමට, පාරිභෝගිකයින් සඳහා ආරක්ෂාකාරී ආහාර පැවතීම සහතික කිරීමට, ආහාර හා සම්බන්ධිත සෞඛ්‍ය අවදානම් අඩු කිරීමට සහ අවසානයේදී ආහාර හානිය අඩු කිරීමට හැකියාව ලැබිණි. මෙම ව්‍යාපෘතිය යටතේ පලතුරු අළෙවිසැල් හිමියන් 192 දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 5ක් පවත්වා ඇත.

### 3.1.10 තල තෙල් නිස්සාරණය සඳහා තාක්ෂණ පැවරීම

ශ්‍රී ලංකාව තුළ තල බීජ වලින් තල තෙල් නිස්සාරණය කිරීම සම්පූර්ණ ස්වයංක්‍රීය ක්‍රියාවලියක් නොවේ. වර්තමානයේදී පවා, එය සිදු කරනු ලබන්නේ "සෙක්කු" ක්‍රමය ලෙස හඳුන්වන පාරම්පරික ක්‍රමය භාවිතයෙන් වන අතර මී තෙල් නිස්සාරණය කරනු ලබන්නේ "පැහෙ" ලෙස හඳුන්වන පාරම්පරික ක්‍රමවේදය යොදාගනිමිනි.එබැවින්, මෙම වෙනස් තෙල් භෝග වලින් උපරිම නිස්සාරණ කාර්යක්ෂමතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා එහි කාර්ය සාධනය වැඩි දියුණු කිරීමේ අරමුණින් අප ආයතනය වෙළඳපොළේ සුලබව පවතින වර්ගයේ නිස්සාරකයක් ඇගයීමට ලක් කරන ලදී. මී, රටකජු සහ තල වැනි විවිධ වර්ගයේ තෙල් නිස්සාරණය කර ගැනීම සඳහා මෙම ක්‍රමය යොදා ගත හැක. මෙ ව්‍යාපෘතියෙහි තාක්ෂණ පැවරීමක් ලෙස මෙම ක්‍රමවේදය ජනප්‍රිය කරවීමට අපට අවශ්‍ය විය. එබැවින්, "තල තෙල් නිස්සාරණය සඳහා තාක්ෂණ පැවරීම" යන මැයෙන් සංවර්ධන ව්‍යාපෘතියක් අප විසින් ආරම්භ කරන ලදී. වවුනියාව, ඕමන්ත, පුදුකුඩුඉරුප්පු සහ අම්පාර යන ප්‍රදේශ හතරක මෙම පුහුණු වැඩසටහන් පැවැත්විණි. පුහුණු වැඩසටහන් හතර සඳහා සහභාගී වූ මුළු පුහුණුලාභීන් සංඛ්‍යාව 90කි. එමගින්, සැකසීමේ ඒකක පිහිටුවිය යුතු විවිධ ස්ථාන හඳුනාගැනීමට අපට හැකියාව ලැබිණි.

### 3.1.11. ගෘහවිද්‍යා ගුරුවරියන් සහ ශිෂ්‍යාවන් සඳහා දේශීය ආහාර ජනප්‍රිය කරවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

කෘෂිකාර්මික ආර්ථිකයක් පවතින ශ්‍රී ලංකාවේ බොහොමයක් ජනතාවගේ ආදායම් ඉපයීම මත කෘෂිකර්මය ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරනු ලැබේ. පවතින කාලගුණික තත්ත්ව, වාරිමාර්ග පහසුකම්, ඉඩම් ආදිය මගින් සහාය ලබමින් දිවයිනෙහි සියළුම දිස්ත්‍රික්කවල විවිධ භෝග වර්ග වගා කරනු ලැබේ. දිවයිනෙහි වගා කරනු ලබන ප්‍රධාන තනි භෝගය වී වන අතර ප්‍රධාන ආහාරය බත් වේ. වී වලට අමතරව බඩඉරිඟු, මුං ඇට, කඩල, සෝයා, කව්පි, මෙනේරි ආදී බොහොමයක් ධාන්‍ය සහ මාෂ භෝග දිවයිනෙහි බහුලව වගා කරනු ලැබේ. මෙම සියළු භෝග ඉහළ පෝෂණ ගුණයන්ගෙන් සහ බොහොමයක් සෞඛ්‍ය ප්‍රතිලාභවලින් යුක්ත වේ. නමුත් වසර ගණනාවකට පෙර සිට විදේශ ආහාර වර්ග රාශියක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබේ. විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඒ සඳහා වියදම් කරනු ලැබේ. උදාහරණයක් ලෙස, තිරිඟු පිටි ආනයනය දැක්විය හැකි වේ. තිරිඟු පිටි වතු ක්ෂේත්‍රයේ ජීවත් වන ජනතාව වැනි සමහර ජනතා කණ්ඩායම්වල ආහාරයෙහි අත්‍යවශ්‍ය සංඝටකයක් වී ඇත. තවද ආනයනය කරන ලද පලතුරුද විශාල වශයෙන් දේශීය වෙළඳපොළෙහි

දක්නට ඇත. වර්තමානයේදී ශ්‍රී ලංකාව සහලින් මෙන්ම බඩ ඉරිඟුවලින්ද ස්වයංපෝෂිය. රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් බොහොමයක් හේතුවෙන් භෝග රාශියක නිෂ්පාදනය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත.

කෙසේවෙතත්, වඩාත් හොඳ වෙළඳපොළ අවස්ථාවන් මෙන්ම වඩා හොඳ ලාභයක් ලබා ගැනීම සඳහා ගොවීන් බලවත් පරිශ්‍රමයක් දරමින් සිටී. අනෙක් අතට පාරිභෝගිකයා වෙළඳපොළ අධික සිල්ලර මිල ගණන් සමග අරගල කරමින් සිටී. තවද වාර්තා වන බෝ නොවන රෝග තත්ත්වයන් සහ පරිභෝජන රටා සහ ආහාර පුරුදු හා සම්බන්ධිත සෞඛ්‍ය ගැටළු දිනෙන් දින නොකඩවා වැඩි වෙමින් පවතී. වේගයෙන් ඉදිරියට ඇදෙන ලෝකය සහ සංවර්ධනය හා යා වීමට ජීවන රටාවන් වෙනස් වීමද මේ සඳහා දායකත්වය දක්වා ඇත.

සෞඛ්‍ය පිළිබඳව නොසැලකීම සහ රස ප්‍රතිලාභ හෝ වෙනත් බොහෝ හේතුන් නිසා බොහොමයක් ජනතාව දේශීය ආහාර නොසලකා හරිනු ලැබේ. නමුත් දේශීය ආහාර පරිභෝජනය වැඩි කිරීමෙන් සියළුම ගොවීන්, පාරිභෝගිකයින් මෙන්ම වෙළෙන්දන්ටද ප්‍රතිලාභ බොහොමයක් අත් කර ගත හැකි වේ. මෙම ප්‍රතිලාභ පෝෂණ, සෞඛමය, ආර්ථිකමය හෝ සමාජමයද විය හැක.

අනාගත ජාතියෙහි කොඳු නාරටිය වන්නේ පාසල් ළමුන් වේ. ඔවුන්ගේ ආහාර පුරුදු හේතුවෙන් බොහොමයක් සෞඛ්‍යමය ගැටළු වාර්තා වී ඇත. ගෘහවිද්‍යාව, ආහාර පිසීමේ විද්‍යාවන්, ආහාර පෝෂණය මෙන්ම ආහාර පුරුදු සමඟ සෘජුවම සම්බන්ධ වන ප්‍රාථමික විෂයකි. එබැවින් පාසල්වල ගෘහවිද්‍යා ගුරුවරියන් සහ ශිෂ්‍යාවන් සඳහා අධ්‍යාපනය ලබා දීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම දේශිය ආහාර පරිභෝජනය ජනප්‍රිය කරවීමේ වැදගත් අංගයක් වන අතර එමගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය මෙන්ම ශ්‍රී ලාංකිකයින්ද නඟා සිටුවිය හැකි වේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප.අ.තා.ආ.දී, මහනුවර දිස්ත්‍රික්කයේ ගන්නොරුව, කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය සහ මල්ලවපිටිය සහ අම්පාර දිස්ත්‍රික්කයේ අම්පාර ප්‍රදේශයේ පුහුණු වැඩසටහන් පවත්වා ඇත. පුහුණු වැඩසටහන් 08ක් පවත්වා ශිෂ්‍යායින් 461 දෙනෙක් මේ සම්බන්ධයෙන් පුහුණු කර ඇත.

### 3.2 වැඩිදියුණු කරන ලද පසු අස්වන් තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම

2014 වර්ෂය තුලදී ප.අ.තා.ආ. යේ ක්ෂේත්‍ර ව්‍යාප්ති වැඩසටහන් තුලින් පහත සඳහන් වැඩිදියුණු කරන ලද පසු අස්වනු තාක්ෂණික ක්‍රමවේද දිවයින පුරා සිටින ගොවීන්ට හඳුන්වා දී ඇත:

| වැඩිදියුණු කරන ලද පසු අස්වනු තාක්ෂණික ක්‍රමවේදය | ගණන |
|---|---|
| අ. මාශ භෝග පොතු ඉවත් කිරීමේ ප.අ.තා.ආ. යන්ත්‍ර ගාල්ලට ලබා දීම | 04 |
| ආ. අතින් ක්‍රියාකරන ප.අ.තා.ආ. බඩඉරිඟු ගැලවීමේ යන්ත්‍රය අනුරාධපුර, තිරප්පනේට ලබා දීම | 02 |

## 4.0 පුහුණුව

සමාලෝචිත වර්ෂය තුළදී පුහුණුව සඳහා වන ඉල්ලුම, විශේෂයෙන්ම පෞද්ගලික සහ සමුපකාර අංශයේ සංවිධානවලින් නොකඩවා වර්ධනය විය. ආයතනය මගින් පැවැත්වූ පුහුණු පාඨමාලා, නිෂ්පාදනය/ව්‍යාප්තිය දිශානත කරගත්, පශ්චාත් අස්වනු ක්‍රියාකාරකම් වල නියැලෙන පුද්ගලයින් උදෙසා තාක්ෂණය පැවරීම දීම ඉලක්ක කරගත් ඒවා විය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සභා, රාජ්‍ය නොවන සංවිධාන යන ආයතන සමඟ සහයෝගිත්වයෙන් ගොවීන් සහ ගෙවිලියන් විශාල සංඛ්‍යාවක්ද පුහුණු කර ඇත.

### 4.1 පැවැත්වූ පුහුණු වැඩසටහන්වල විස්තර:

*අ) යන්ත්‍රාගාර පුහුණුව*

1. 2014 නොවැම්බර් මස 20 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 19 වැනි දින දක්වා අනුරාධපුර පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේදී ඔස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන්හි ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින් 06 දෙනෙකු පුහුණු කරන ලදී.
2. 2014 ඔක්තෝබර් මස 01 වැනි දින සිට 2015 ජනවාරි මස 30 වැනි දින දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ යාන්ත්‍රික, නිෂ්පාදන, රසායනික ඉංජිනේරු උපාධි අපේක්ෂකයින් හතර දෙනෙකු පුහුණු කරන ලදී.
3. 2014.09.09 සාට 2015.03.09 දක්වා කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ යන්ත්‍රාගාර පුහුණුලාභියෙකු වැඩපොළ තාක්ෂණය සම්බන්ධයෙන් පුහුණු කරන ලදී.

*ආ) අනුරාධපුර ප.අ.තා.ආ. නේවාසික පුහුණුව:*

2014 වර්ෂය තුළදී, කෙටි කාලීන නේවාසික පුහුණු පාඨමාලා 53ක් පැවැත් වූ අතර පුද්ගලයින් 1808 දෙනෙකු පශ්චාත් අස්වනු තාක්ෂණයෙහි විවිධ විෂයයන්හි පුහුණු කර ඇත. විස්තර 01 රූපයෙන් දැක්වේ.

**රූපය 1: 2014 වර්ෂයේදී ප.අ.කා.ආ. යේ නේවාසික පුහුණුලාභීන් කාණ්ඩ**

පුහුණුව ලැබූ මුළු ගණන - 1808

මුළු පුහුණු වැඩසටහන් ගණන - 53




**පුහුණුවන්නන් කාණ්ඩ:**

- A) ගොවීන්, ගෙවිලියන් සහ ගොවි සංවිධාන සාමාජිකයින් - 439(24%)
- B) ව්‍යාපෘති ප්‍රතිලාභීන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් - 98(6%)
- C) පලතුරු සහ එළවළු වගා කරන්නන්, එකතු කරන්නන්, සහල් සහ අනෙකුත් ධාන්‍ය සැකසුම්කරුවන් - 202(11%)
- D) රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාප්ති නිලධාරින් - 303(17%)
- E) ද්විතීයික පාසල්, විශ්වවිද්‍යාල, කෘෂි සහ කාර්මික විශ්වවිද්‍යාල සිසුන් - 742(41%)
- F) විදේශිකයින් - 24(1%)

***ඇ) අනේවාසික පුහුණු, ක්ෂේත්‍ර මට්ටමේ පුහුණු/ඉදිරිපත්කිරීම්***

2014 වර්ෂය තුළදී අනේවාසික පුහුණු, ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් සහ ආදර්ශන 18ක් පවත්වා පුද්ගලයින් 1901ක් පුහුණු කර ඇත. සමාලෝචිත වර්ෂය තුළදී ආයතනය විසින් එහි ක්ෂේත්‍ර මධ්‍යස්ථාන හරහා තාක්ෂණ පැවරීමේ ක්‍රියාකාරකම් විශේෂයෙන් ප්‍රධාන භෝග නිෂ්පාදන ප්‍රදේශයන්හිදී ඵලදායී අන්දමින් සිදු කර ගෙන ගොස් ඇත. අම්පාර, නුවරඑළිය, අඹන්පොළ (කුරුණෑගල දිස්ත්‍රික්කය) මහනුවර, ලුනාම (හම්බන්තොට දිස්ත්‍රික්කය), අනුරාධපුර, පොළොන්නරුව, ගාල්ල, මාතර සහ යාපනය යන ප්‍රදේශවල ක්ෂේත්‍ර මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් 245ක් පවත්වා පුද්ගලයින් 8915 දෙනෙකු පුහුණු කර ඇත.

රූපය 2: 2014 වර්ෂයේදී ප.අ.තා.ආ.යේ අනේවාසික පුහුණුවන්නන් කාණ්ඩ
පුහුණුව ලැබූ මුළු ගණන - 1901
මුළු පුහුණු වැඩසටහන් ගණන - 18




**පුහුණුවන්නන් කාණ්ඩ:**

A) ගොවීන්, ගෙවිලියන් සහ ගොවි සංවිධාන සාමාජිකයින් - 1438 (76%)
B) ව්‍යාපෘති ප්‍රතිලාභීන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් - 20(1%)
C) පලතුරු සහ එළවළු වගා කරන්නන්, එකතු කරන්නන්, සහල් සහ අනෙකුත් ධාන්‍ය සැකසුම්කරුවන් - 235(12%)
D) රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාප්ති නිලධාරින් - 188 (10%)
E) ද්විතීයික පාසල්, විශ්වවිද්‍යාල, කෘෂි සහ කාර්මික විශ්වවිද්‍යාල සිසුන් - 20(1%)

### 4.3 ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය

2014 වර්ෂය තුළදී ප.අ.තා.ආ. විසින් පහත දක්වා ඇති පරිදි දිවයින පුරා පැවති ප්‍රදර්ශන 03ක් සඳහා සහභාගී වී ඇත:

1. 2014.08.11 සිට 2014.08.12 දක්වා කොළඹ පැවති ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනය
2.2014.02.24 සිට 2014.03.01 දක්වා කුලියාපිටියේ පැවති “දැයට කිරුළ” ප්‍රදර්ශනය.
3.2014.09.09 සිට 2014.09.14 දක්වා මාතර තෙලිජ්ජවිල පැවති “ගොවි සතිය” ප්‍රදර්ශනය

## 5. උපදේශන සහ උපදේශක සේවාවන්

### 5.1 ප.අ.තා.ආ. කාර්ය මණ්ඩලය විසින් සිදු කර ඇති උපදේශන ගණන

2014 වර්ෂය තුළදී, ආයතනය නව පශ්චාත් අස්වනු තාක්ෂණ ක්‍රමවේදයන් සොයා ගැනීමට ලක් කළ අතර එම තාක්ෂණ ක්‍රමවේදයන්ට අනුව ඔවුන්ගේ තාක්ෂණ ක්‍රමවේද වැඩිදියුණු කර ගැනීම සඳහා ඒවා ව්‍යවසායකයින් හට ලබා දීමට හැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් නව මෝල් ආරම්භ කිරීම,

දැනටමත් පවතින මෝල් නවීකරණය කිරීමට, ආහාර සැකසීමේ කර්මාන්තශාලා පිහිටුවීමට, වියළන ඒකක පිහිටුවීමට, නව ගබඩා ව්‍යුහයන් ඉදි කිරීමට සහ වෙනත් පශ්චාත් අස්වනු ක්‍රියාකාරකම් හා බැඳුනු තාක්ෂණික ගැටලු නිරාකරණය කර ගැනීමට නව ආයෝජකයන් 122 දෙනෙකු, පෞද්ගලික සහල් මෝල් කරුවන්, මෝල් හිමියන්, සමුපකාර සංගම්, පෞද්ගලික වෙළෙන්දන්, රාජ්‍ය නොවන සංවිධාන සහ දිවයිනෙහි පශ්චාත් අස්වනු ක්‍රියාකාරකම්වල නියුතු පුද්ගලයින් ප.අ.තා.ආ.යේ මඟ පෙන්වීම ලබා ගන්නට යෙදිණි.
2014 වර්ෂයේදී ප.අ.තා.ආ. විසින් සම්පූර්ණ කරන ලද උපදේශන පිළිබඳ විස්තර 03 වන රූප සටහනෙහි දක්වා ඇත.

**03 රූප සටහන. 2014 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද උපදේශන/සපයන ලද තොරතුරු පිළිබඳ විස්තර**




**උපදේශන ක්ෂේත්‍ර:**

| | |
|---|---|
| **a)** සහල් සැකසුම් කර්මාන්තශාලා පිහිටුවීම | 02 |
| **b)** පවතින සැකසුම් කර්මාන්තශාලා ප්‍රතිසංස්කරණය සහ නවීකරණය කිරීම | 15 |
| **c)** සහල් සහ වෙනත් පිටි සැකසුම් | 22 |
| **d)** කුළුබඩු සකස් කිරීම | 18 |
| **e)** මිරිස්, පළතුරු සහ එළවළු, කුළුබඩු, ධාන්‍ය/ ඖෂධ බෝග වියළීම | 10 |
| **f) RPRDC/ IPHT** පශ්චාත් අස්වනු යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 14 |
| **g)** ග්‍රාමීය මට්ටමේ සහල් සැකසුම් | 01 |
| **h)** යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ඇගයීම | **04** |
| **i)** පලතුරු සහ එළවළු සැකසීම | 02 |
| **j)** නූඩ්ල්ස් නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික තොරතුරු | 02 |
| **k)** තෙල් නිස්සාරණය | 08 |
| **l)** සහල් ප්‍රතිශතය පිළිබඳ තොරතුරු | 04 |
| **m)** යන්ත්‍රසූත්‍ර තක්සේරු කිරීම | **02** |
| **n)** සහල් සැකසීම සහ තැම්බීම | 10 |

වැදගත් උපදේශන පිළිබඳ විස්තර

a) රතු නාඩු සහල් ප්‍රභේදයෙහි සහල් ප්‍රතිශතය පිළිබඳ තොරතුරු හම්බන්තොට, දිස්ත්‍රික් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කාර්යාලයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම් ක්‍රියාත්මක කිරීම) වෙත ලබා දෙන ලදී.

b) ග්‍රාමීය ප්‍රදේශවල වී කෙටීම සඳහා ඩොන්ග් යැන්ග් සහල් මෝලෙහි තාක්ෂණික යෝග්‍යතාවය පිළිබඳ වාර්තාවක් ගාල්ල, මාගල්ල, මාතර පාර, 169, රේන්ෆොරෙස්ට් රෙස්කිවු ඉන්ටනැෂනල්හි සමන් කුමාර මහතාට 2014 අගෝස්තු 14 වන දින ලබා දෙන ලදී.

c) පලුගස්දමන විවිධ සේවා සමුපකාර සමිති (පෞද්.) සමාගමට අයත් සහල් පිටි සැකසුම් යන්ත්‍ර දෙකක් පිළිබඳව තක්සේරු වාර්තාවක් 2014 අගෝස්තු 21 වන දින ලබා දෙන ලදී.

d) ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයට අයත් කලංකුට්ටිය සහල් කෙටීමේ සංකීර්ණය සඳහා නව සහල් පිටි කෙටීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා තාක්ෂණික සහාය 2014 නොවැම්බර් 26 වන දින ලබා දෙන ලදී.

e) සහල් කෙටීමේ වටිනාකම් එක්කළ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ මිලදී ගැනීමේ ලැයිස්තුවක් යාපනය, නවලාර් පාර, උතුරු පළාත් සභාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට 2014 ජූලි 08 වන දින ලබා දී ඇත.

f) පැරණි වී තොග විනාශ කිරීම සඳහා කමිටු සාමාජිකයෙකු ලෙස 2014 අගෝස්තු 20 වන දින සහභාගි වන ලදී.

g) ඇඹරුම් යන්ත්‍රයක් පිළිබඳ තාක්ෂණ වාර්තාවක් උතුරු මැද පළාත් සභාවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ පී.බී.එල්. ප්‍රේමනාත් මහතාට 2014 දෙසැම්බර් 11 වන දින ලබා දී ඇත.

h) අමු සහල් කෙටීමේ ප්‍රතිශතය පිළිබඳ තොරතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති සහ පුහුණු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ (ව්‍යාපෘති සහ පුහුණු) ආර්.එස්. විජේසේකර මහතාට ලබා දී ඇත.

i) ප.අ.තා.ආ.යේ බහු භෝග වියළන යන්ත්‍රයක් පිළිබඳ ඉදිරිපත් කිරීමක් පිහිඹුව, හමස්ගහවත්ත පදිංචි යූ.ඩී.එස්. වීරසූරිය මහතා 2014 පෙබරවාරි 05 වන දින සිදු කර ඇත.

j) සහල් පිටි කිරීමේ යන්ත්‍රසූත්‍ර සඳහා යන්ත්‍ර පිරිවිතර මොණරාගල, පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා වෙත 2014 පෙබරවාරි 19 වන දින ලබා දී ඇත.

k) සහල් පිටි කිරීමේ යන්ත්‍රසූත්‍ර සඳහා යන්ත්‍ර පිරිවිතර බදුල්ල, කැප්පෙටිපොළ පාර, අංක 199, ඌව පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා වෙත 2014 පෙබරවාරි 20 වන දින ලබා දී ඇත.

l) තැටි වියළන යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම පිළිබඳ ඉදිරිපත් කිරීම් සහ උපදේශන ගලගෙදර, මිනිගමුව, අංක 90/සී හි පදිංචි ඩබ්ලිව්.එම්.සී.කේ. එගොඩපිටිය මහතාට 2014 මාර්තු 07 වන දින ලබා දී ඇත.

m) කුරක්කන් පොතු ඉවත් කිරීමේ සහ කවුපි පොතු ඉවත් කිරීමේ යන්ත්‍ර පිළිබඳ ඉදිරිපත් කිරීම් සහ උපදේශන තඹුත්තේගම, තම්මැන්නාපුර, අංක 258හි පදිංචි ඩබ්ලිව්.ජී. ජයසූරිය මහතාට 2014 අප්‍රේල් 25 වන දින ලබා දී ඇත.

n) බඩ ඉරිඟුවල ගල් වැලි ඉවත් කිරීමේ යන්ත්‍රයක් පිළිබඳ ඉදිරිපත් කිරීමක් එප්පාවල, සාලියදිවුල්වැව, අංක 60හි පදිංචි ඩී.ටී. ධර්මපාල මහතාට 2014 ජුනි 24 වන දින සිදු කර ඇත.

o) සහල් වියළීම සහ වියළන යන්ත්‍ර පිළිබඳ ඉදිරිපත් කිරීමක්, සැලසුම් සපයා දීමක් සහ උපදෙස් ලබා දීමක් කැකුණගොල්ල, අරක්යාල, අංක 49/1හි පදිංචි ඒ.එච්.එම්. කාසිම් මහතාට 2014 අගෝස්තු 19 වන දින සිදු කර ඇත.

p) සහල් තැම්බීම පිළිබඳ උපදෙස් කහටගස්දිගිලිය, කැකිරාව හන්දිය පදිංචි කේ.ඒ. උපුල් ප්‍රියන්ත ගුණපාල මහතාට 2014 සැප්තැම්බර් 10 වන දින ලබා දී ඇත.

q) කුළුබඩු වියළීම පිළිබඳ ඉදිරිපත් කිරීමක්, උපදෙස් සහ අත් පත්‍රිකා ලබා දීමක් කඩවත, පහළ බියන්වල, අංක 396/4හි පදිංචි කේ.කේ.එස්. විජේසිංහ මහතාට 2014 ඔක්තෝබර් 29 වන දින සිදු කර ඇත.

r) සහල් මෝල්වල කාබොරන්ඩම් ගල් අලුත්වැඩියා කිරීම පිළිබඳ උපදෙස් තඹුත්තේගම, කාර්මික පෙදෙස, "මහවැලි ඇග්‍රොමැක්"හි ඉස්මතුන් මහතාට 2014 නොවැම්බර් 18 වන දින ලබා දී ඇත.

s) සහල් මෝල් හිමියන්ගේ ලිපින ලැයිස්තුවක් වව්නියාව, වන සංරක්ෂණ කාර්යාලයේ එන්.එච්.එම්.එස්. නාරම්පනාව මහතාට 2014 නොවැම්බර් 21 වන දින ලබා දී ඇත.

t) සහල් මෝල් හතරක් නවීකරණය කර ඇත. මෙම ක්‍රියාවලිය මගින් සහල්වල තත්ත්වය අපනයන තත්ත්වය දක්වා වැඩිදියුණු කර ඇති අතර එමගින් ගොවීන්ට ඔවුන්ගේ නිෂ්පාදන

සඳහා ඉහළ මිලක් ලබා ගත හැකි වනු ඇත. පරිසර දූෂණය හැකිතාක් දුරට අවම කර ගැනීම සඳහා උත්සාහයන් දරනු ඇත.

u) සහල් සකස් කිරීම පිළිබඳ උපදෙස් දියබෙදුම, ඇලිකිඹුලාව, අංක 508හි පදිංචි ඒ.එම්.ඩී.බී. අත්තනායක මහතාට 2014 පෙබරවාරි 13 වන දින ලබා දී ඇත.

v) මහව, වතුපාලගම, "අඹ සෙවණ"හි පදිංචි ඩබ්ලිව්.ඒ.එම්. කරුණාරත්න මහතාට 2014 පෙබරවාරි 13 වන දින සහල් මෝලක්, පිටි මෝලක් සහ තෙල් මෝලක් පිළිබඳ ඉදිරිපත් කිරීම් සිදු කර උපදෙස් ලබා දී ඇත.

w) පොළොන්නරුව, ලක්ෂ උයන, අංක 7/4හි පදිංචි ආර්.ඒ.ඩී. ප්‍රියතිස්ස බණ්ඩාර මහතාට 2014 පෙබරවාරි 12 වන දින සහල් තැම්බීමේ උපකරණයක් පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කර උපදේශන ලබා දී ඇත.

x) මතේරුව, උපුල් වෙහෙර පදිංචි උපුල් සංජීව මහතාට 2014 පෙබරවාරි 12 වන දින සහල් තැම්බීමේ උපකරණයක් පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කර උපදේශන ලබා දී ඇත.

y) කැබිතිගොල්ලැව, රළපනාව, හඳගල පදිංචි එස්.එම්.ඒ. සේනානායක මහතාට 2014 මාර්තු 12 වන දින පසු අස්වනු යන්ත්‍රසූත්‍ර පිළිබඳ උපදෙස් ලබා දී ඇත.

z) සහල් තැම්බීමේ අප ජල ප්‍රතිකාර පිළිබඳ උපදෙස් මහ ඉලුප්පල්ලම, කුඹුක් ඇන්ද, අංක 31හි පදිංචි ඒ.ඩී. ප්‍රියංකර දිවුල්ගස්නායක මහතාට 2014 අප්‍රේල් 28 වන දින ලබා දී ඇත.

aa) සහල් තැම්බීමේ අප ජල ප්‍රතිකාර පිළිබඳ උපදෙස් කොළඹ 08, ගුණසේකර පටුමග, අංක 1, කුමජායි සම්මිලෝ ලිමිටඩ්හි යූ.ර්. කොස්වත්ත මහතාට 2014 ජූනි 10 වන දින ලබා දී ඇත.

bb) ඇඹරීමේ යන්ත්‍ර පිළිබඳ උපදෙස් හිඟුරක්ගොඩ දකුණ, අන්කර 70, 255/2හි පදිංචි අයි.ඒ. දිසානායක මහතාට 2014 ජූලි 07 වන දින ලබා දී ඇත.

cc) ගම්මිරිස් වියළීම පිළිබඳ උපදෙස් පිහිඹුව, හැටගහවත්ත පදිංචි දර්ශන දොන්සූරිය මහතාට 2014 ජූලි 08 වන දින ලබා දී ඇත.

dd) තැම්බූ වී නිෂ්පාදනය පිළිබඳ උපදෙස් අනුරාධපුර, සුචරිතගම, ගලේ කඩේ පදිංචි එන්.ජේ. ලියනගේ මහතාට 2014 ජූලි 11 වන දින ලබා දී ඇත.

ee) සහල් මෝල් හිමියන්ගේ ලැයිස්තුවක් ඩබ්ලිව්.එම්. පුංචි බණ්ඩා සහ පුත්‍රයෝ (පුද්.) සමාගමෙහි කේ.ඒ. චමින්ද ප්‍රදීප් කුමාර මහතාට (අළෙවි ප්‍රවර්ධන නිලධාරි) 2014 ජූලි 31 වන දින ලබා දී ඇත.

ff) සහල් තැම්බීමේ ටැංකි පිළිබඳ උපදෙස් ඉපලෝගම, තුත්තිරිපිටගම, හල්මිල්ලකොටුව පදිංචි ඩී.එම්.සී.ආර්. දිසානායක මහතාට 2014 අගෝස්තු 12 වන දින ලබා දී ඇත.

gg) ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයට අයත් කලංකුට්ටිය සහල් කෙටීමේ සංකීර්ණය සඳහා නව සහල් පිටි කෙටීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා තාක්ෂණික සහාය 2014 නොවැම්බර් 26 වන දින ලබා දෙන ලදී.

hh) සහල් පිටි මෝල් 11ක් නවීකරණය කරන ලදී. මෙම ක්‍රියාවලිය හේතුවෙන් තත්ත්වයෙන් ඉහළ යන්ත්‍රසූත්‍ර භාවිතා කළ හැකි වන අතර එමගින් සහල් පිටි අංශු වඩාත් තුනී වනු ඇත. මෙමගින් වඩාත් ගුණාත්මක තත්ත්වයේ නිෂ්පාදන සිදු කළ හැකි වේ.

ii) සහල් පිටි කිරීමේ යන්ත්‍රසූත්‍ර සඳහා යන්ත්‍ර පිරිවිතර මොණරාගල, පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා වෙත ලබා දී ඇත.

jj) සහල් පිටි කිරීමේ යන්ත්‍රසූත්‍ර සඳහා යන්ත්‍ර පිරිවිතර බදුල්ල, කැප්පෙටිපොළ පාර, අංක 199, ඌව පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා වෙත 2014 පෙබරවාරි 20 වන දින ලබා දී ඇත.

kk) සහල් වියළීම සහ වියළන යන්ත්‍ර පිළිබඳ ඉදිරිපත් කිරීමක්, සැලසුම් සපයා දීමක් සහ උපදෙස් ලබා දීමක් කැකුණගොල්ල, අරක්යාල, අංක 49/1හි පදිංචි ඒ.එච්.එම්. කාසිම් මහතාට 2014 අගෝස්තු 19 වන දින ලබා දී ඇත.

ll) පලුගස්දමන විවිධ සේවා සමුපකාර සමිති (පුද්.) සමාගමට අයත් සහල් පිටි සැකසුම් යන්ත්‍ර දෙකක් පිළිබඳව තක්සේරු වාර්තාවක් 2014 අගෝස්තු 21 වන දින ලබා දෙන ලදී.

mm) කුළුබඩු අයිතම නිෂ්පාදන ඒකක 09ක් ආරම්භ කරන ලදී. පාරිභෝගිකයන් හට වඩාත් හොඳ තත්ත්වයේ කුළුබඩු අයිතම ලබා ගැනීම සඳහා මෙය උපකාරී වනු ඇත.

nn) සහල් මෝලක් පිහිටුවීම පිළිබඳ උපදෙස් වක්කඩුව, දැඩිගාවල, "සිතුමිණ", අංක 149/ඒ පදිංචි රුවිර ශාමන්ත ගුණතිලක මහතාට 2014 ජනවාරි 03 වන දින ලබා දී ඇත.

oo) පවතින සහල් මෝල වැඩිදියුණු කිරීම සඳහා උපදෙස් පයාගල, කිරිදිවත්ත පදිංචි ඩබ්ලිව්.එම්. ප්‍රසන්න සාලිය තිලකරත්න මහතාට 2014 ජනවාරි 03 වන දින ලබා දී ඇත.

pp) ප.අ.තා.ආ.යේ බහු භෝග වියළන යන්ත්‍රයක් පිළිබඳ ඉදිරිපත් කිරීමක් පිහිඹුව, හමස්ගහවත්ත පදිංචි යූ.ඩී.එස්. වීරසූරිය මහතාට 2014 පෙබරවාරි 05 වන ලබා දී ඇත.

qq) මීගමුව, කිඹුලාපිටිය පාර, අක්කර 50, අංක 312හි පදිංචි එස්.ඩබ්ලිව්. ශ්‍රේෂන් ක්‍රිස්තෝ මහතාට 2014 පෙබරවාරි 18 වන දින සහල් කෙටීමේ යන්ත්‍රසූත්‍ර පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කර උපදෙස් ලබා දී ඇත.

rr) සහල් පිටි සකස් කිරීම පිළිබඳ උපදෙස් තඹුත්තේගම, පහළගම, පොටියාගම පදිංචි ඩී.එම්.පී. ටිකිරි මැණිකේ මහත්මියට 2014 මැයි 09 වන දින ලබා දී ඇත.

ss) සහල් නූඩ්ල්ස් යන්ත්‍රාගාරයක් පිළිබඳ උපදෙස් නාරම්මල, කුරුණෑගල පාර, අංක 56/58හි පදිංචි එම්. අරුණ රණසිංහ මහතාට 2014 අගෝස්තු 05 වන දින ලබා දී ඇත.

tt) සහල් පිටි නිෂ්පාදන සකස් කිරීම පිළිබඳ උපදෙස් මරදන්කඩවල, වළගම්බාහුව, දයාගම පදිංචි ආර්.එච්.ඒ.බී. රණසිංහ මහතාට 2014 අගෝස්තු 11 වන දින ලබා දී ඇත.

uu) ගෘහස්ථ මට්ටමින් සහල් තැම්බීම පිළිබඳ උපදෙස් ගලෙන්බිඳුනුවැව, හුරුළුනිකවැව, අංක 498බී පදිංචි ඩී.ජී. මල්ලිකා විමලවර්ධන මහත්මියට 2014 අගෝස්තු 14 වන දින ලබා දී ඇත.

vv) ඩී.එල්.ඊ. අමරසිංහ මහතාට 2014 අගෝස්තු 19 වන දින කුළුබඩු සකස් කිරීමේ පොත් පිංචක් ලබා දී කුළුබඩු සැකසීම පිළිබඳ උපදෙස් ලබා දී ඇත.

ww) ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයට අයත් කලංකුට්ටිය සහල් කෙටීමේ සංකීර්ණය සඳහා නව සහල් පිටි කෙටීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා තාක්ෂණික සහාය 2014 නොවැම්බර් 26 වන දින ලබා දෙන ලදී.

xx) තල තෙල්, කොහොඹ තෙල් සහ මී තෙල් නිෂ්පාදනය කිරීමේ ඒකක 4ක් ආරම්භ කරන ලදී. මෙම ඒකකවලින් ස්වයං රැකියා අවස්ථාවන් උදා වී ඇත.

yy) සහල් සකස් කිරීම සහ කුළුබඩු සකස් කිරීම පිළිබඳ උපදෙස් මකුල්පොත, රණසිංහ ස්ටෝර්ස්හි පදිංචි බී.එම්. වනසිංහ මහතාට 2014 අප්‍රේල් 24 වන දින ලබා දී ඇත.

zz) කුළුබඩු සකස් කිරීම පිළිබඳ උපදෙස් අනුරාධපුර, අදියර 3, දහයියාගම හංදිය, 3122හි පදිංචි ප්‍රභාත් වීරසිංහ මහතාට 2014 මැයි 13 වන දින ලබා දීඇත.

aaa) අනුරාධපුර, යාපනය හංදිය, නාගදීප මාවත, චින්තන ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රීස්හි එල්.අයි. ගෝනපිනුවල මහතාට 2014 අගෝස්තු 05 වන දින කුළුබඩු සකස් කිරීම පිළිබඳ උපදෙස් ලබා දී ඉදිරිපත් කිරීමක් සිදු කර ඇත.

bbb) සහල් නූඩ්ල්ස් සැකසීමේ යන්ත්‍රාගාරයක් පිළිබඳ උපදෙස් නාරම්මල, කුරුණෑගල පාර, අංක 56/58 පදිංචි එම්. අරුණ රණසිංහ මහතාට 2014 අගෝස්තු 05 වන දින ලබා දී ඇත.

ccc) සහල් පිටි නිෂ්පාදන සකස් කිරීම පිළිබඳ උපදෙස් මරදන්කඩවල, වළගම්බාහුව, දයාගම පදිංචි ආර්.එච්.ඒ.බී. රණසිංහ මහතාට 2014 අගෝස්තු 11 වන දින ලබා දී ඇත.

ddd) කුළුබඩු සහ තෙල් නිෂ්පාදනය පිළිබඳ උපදෙස් වාරියපොළ, කැකුළුගස්වැව, සූරියගල මාවත පදිංචි ටී.එම්.ජේ.බී. තෙන්නකෝන් මහතාට 2014 සැප්තැම්බර් 14 වන දින ලබා දී ඇත.

eee) මධ්‍යම පරිසර අධිකාරියේ EIA ඒකකයේ නිමල් චන්ද්‍ර ගුණවඩනගේ මහතාට ඔහුගේ ආචාර්ය උපාධි අධ්‍යයනය සඳහා සහල් කෙටීම පිළිබඳ උපදෙස් 2014 ඔක්තෝබර් 10 වන දින ලබා දී ඇත.

fff) වව්නියාව, ඕමන්තේ, අලෙකොල්ලුපොත්තකුලම් පදිංචි කේ. චන්ද්‍රපලම් මහතාට 2014 ඔක්තෝබර් 15 වන දින තල තෙල් නිස්සාරණය පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කර උපදෙස් ලබා දී ඇත.

ggg) කුළුබඩු සහ සහල් පිටි සකස් කිරීම පිළිබඳ උපදෙස් මත්තෙගොඩ, සල්ගස් පෙදෙස, 137හි පදිංචිකේ.ඩී. මංජුල සේනාධීර මහතාට 2014 දෙසැම්බර් 10 වන දින ලබා දී ඇත.

hhh) කුළුබඩු සහ කුළුබඩු සකස් කිරීමේ යන්ත්‍රසූත්‍ර සහ තෙල් නිස්සාරණය පිළිබඳ උපදෙස් ශ්‍රාවස්තිපුර, සුදර්ශන මාවත, "සහන්"හි පදිංචි ඒ.එම්.කේ. කුමාරසිංහ මහතාට 2014 දෙසැම්බර් 16 වන දින ලබා දී ඇත.

iii) කුළුබඩු සහ කුළුබඩු සකස් කිරීමේ යන්ත්‍රසූත්‍ර සහ තෙල් නිස්සාරණය පිළිබඳ උපදෙස් අනුරාධපුර, කොරකහවැව, ජල සම්පත් මණ්ඩලයෙහි දිනෙත් සිරිවර්ධන මහතාට 2014 දෙසැම්බර් 16 වන දින ලබා දී ඇත.

jjj) ප.අ.තා.ආ.යේ බහු භෝග වියළන යන්ත්‍රය මගින් කුළුබඩු වියළීම පිළිබඳ අත් පත්‍රිකා දොඩන්දූව, දෙල්ගහදූව පදිංචි එස්.එම්. චමත් යසන්ත මහතාට 2014 සැප්තැම්බර් 15 වන දින යවා ඇත.

Kkk) දෙහි යුෂ කල් තබා ගැනීම, තක්කාලි සහ මිරිස් සෝස් සඳහා කල් තබා ගැනීමේ ද්‍රව්‍ය සහ බෝතල් මුද්‍රා යන්ත්‍රයක් පිළිබඳ තොරතුරු ඇතුළත් අත් පත්‍රිකා සහ උපදෙස් මැල්සිරිපුර, මඩහපොල, වුඩ්ලන්ඩ් වත්ත, අංක 06හි පදිංචි කමනි ප්‍රියංගනී අක්මීමන මහත්මියට 2014 සැප්තැම්බර් 15 වන දින ලබා දී ඇත.

Mmm) සහල් තැම්බීමේ උපකරණ පිළිබඳ ඉදිරිපත් කිරීමක් කහටගස්දිගිලිය, කැකිරාව හංදිය පදිංචි කේ.ඒ. උපුල් ප්‍රියන්ත ගුණපාල මහතාට 2014 සැප්තැම්බර් 10 වන දින සිදු කර ඇත.

Nnn) බඩ ඉරිඟුවල ගල් වැලි ඉවත් කිරීමේ යන්ත්‍රයක් පිළිබඳ ඉදිරිපත් කිරීමක් එප්පාවල, සාලියදිවුල්වැව, අංක 60 පදිංචි ඩී.ටී. ධර්මපාල දිසානායක මහතාට 2014 ජුනි 24 වන දින සිදු කර ඇත.

**5.2** ධාන්‍ය නියැදි විශ්ලේෂණය

| නම | නියැදි වර්ගය | නියැදි සංඛ්‍යාව | සිදු කරන ලද විශ්ලේෂණය |
|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම්, මඩකලපුව | වී | 02 | තත්ත්ව විශ්ලේෂණය |
| ආයුර්වේද රෝහල අනුරාධපුර | තල තෙල් | 04 | තත්ත්ව විශ්ලේෂණය |
| මහ බැංකුව | සහල් | 02 | තත්ත්ව විශ්ලේෂණය |
| දිස්ත්‍රික් ලේකම්, අම්පාර | සහල් | 03 | තත්ත්ව විශ්ලේෂණය |
| පෞද්. අංශය හොරොව්පතාන | බඩ ඉරිඟු | 03 | තත්ත්ව විශ්ලේෂණය |
| පූජ්‍ය පියරතන හිමි එප්පාවල | වී | 02 | තත්ත්ව විශ්ලේෂණය |

## 6. ප්‍රචාරය/ ප්‍රකාශන

### 6.1 පුවත්පත් ලිපි/ ප්‍රවෘත්ති

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී ප.අ.තා.ආ. ගේ ක්‍රියාකාරකම් ජනමාධ්‍ය තුළින් ප්‍රචාරය කරන ලද අතර විස්තර පහත දක්වා ඇත:

**දිනපතා පුවත්පත්වල පළවූ ලිපි**

1. 2014 අප්‍රේල් මස 17 වැනි දින "දිනමිණ" පුවත්පතෙහි පළවූ "සෝයා බෝංචි ගබඩා කිරීමේ නව ක්‍රම"- ප.අ.තා.ආ. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි, ආචාර්ය ඩී.එම්.සී.සී. ගුණතිලක මහතා සමඟ පැවති සාකච්ඡාවෙන් පසුව සකුන්තලා ජයසිංහ මහත්මිය විසින් සකස් කරන ලද ලිපිය.
2. 2014 සැප්තැම්බර් මස 04 වැනි දින ලංකාදීප පුවත්පතෙහි පළවූ "අස්වනු නෙළීමේදී වී අස්වැන්නෙන් කොටසක් හානි වීම" - ප.අ.තා.ආ. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි, ආචාර්ය ඩී.එම්.සී.සී. ගුණතිලක මහතා සමඟ පැවති සාකච්ඡාවෙන් පසුව කුමාර ශ්‍රී ලියනආරච්චි මහතා විසින් සකස් කරන ලද ලිපිය.
3. 2014 ජුනි මස 13 වැනි සිකුරාදා "දිනමිණ" පුවත්පතෙහි පළවූ "පසු අස්වනු තාක්ෂණයෙහි උන්නතිය" - ප.අ.තා.ආ. අධ්‍යක්ෂ ආචාර්ය ස්වර්ණශිකා තිලකරත්න මහත්මිය, ප.අ.තා.ආ. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි, ආචාර්ය ඩී.එම්.සී.සී. ගුණතිලක මහතා සහ ප.අ.තා.ආ. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී ආචාර්ය චම්පා වික්‍රමආරච්චි මහත්මිය සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව සකුන්තලා ජයසිංහ මහත්මිය විසින් සකස් කරන ලද ලිපිය.

## 6.2 ප.අ.තා.ආ. ප්‍රකාශන බෙදා හැරීම

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය පිළිබඳ අත් පත්‍රිකා, පත්‍රිකා සහ වෙනත් තොරතුරු සඟරා පිටපත් 25,680 සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙන් ප්‍රකාශයට පත් කරන ලද අතර ඒවා ආයතනයේ ප්‍රතිලාභීන් වෙත නිකුත් කරන ලදී.

## 7.0 ප.අ.තා.ආ.යේ පහසුකම් භාවිතා කරන ලද අනෙකුත් ආයතන

2014 වර්ෂය තුළදී පහත සඳහන් ආයතන/සංවිධාන ප.අ.තා.ආ. සම්මන්ත්‍රණ සහ නේවාසිකාගාර පහසුකම් භාවිතා කර ඇත.

| අයිතම අංකය | ආයතනයේ නම | වාර ගණන |
|---|---|---|
| | | |
| 1) | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 05 |
| 2) | ප්‍රධාන ලේකම් කාර්යාලය(උතුරු මැද පළාත) | 08 |
| 3) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය(උතුරු මැද පළාත) | 01 |
| 4) | පුද්ගලයින් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව | 01 |
| 5) | ග්ලෝබල් ලයිෆ්ස්ටයිල්ස් (ශ්‍රී ලංකා) | 02 |
| 6) | ලංකා ගමනාගමන මණ්ඩලය, රජරට කලාපය, අනුරාධපුර | 01 |
